ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැමිණ කළ නුඹලා බලය ලබන්නාහුය....." (ක්‍රියා 1 : 8)

81 වන වෙළුම අංක 04 (964) 2022 ජූලි / අගෝස්තු

අපගේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා අනුයාවශ්‍යය ආත්මයාණන් වහන්සේගේ බලය

සභාව ආත්මයාණන් වහන්සේගේ නිර්මාණයකි. එය ඇදිහිලිවන්ත ප්‍රජාවගේ ආගමික ජීවිතයේ ආරම්භයේ සිට අවසානය දක්වා ආත්මයාණන් වහන්සේට බැඳී සිටීමයි. උන්වහන්සේගෙන් වෙන් වූ ස්ථානයේ දී කිතුණුවන් හෝ සභාවක් නොමැත. **"එබැවින් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් කරුණුකොටගෙන කථා කරන්නා වූ කිසිවෙක් යේසුස් වහන්සේ ශාලපත් කෙනෙකැයි නොකියන බවත් ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන විස, යේසුස් වහන්සේ ස්වාමීන් වහන්සේ යයි කියන්ට කිසිවෙකුට නුපුළුවන් බවත් මම නුඹලාට කියමි."** (1 කොරින්ති 12:3) එමෙන්ම උන්වහන්සේගේ සභාවේ සාමාජිකයන්ගේ පළමු ස්වභාවය විය යුතු වන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමීත්වය ඉදිරියේ පසුතැවිලිවීමයි.

ඉහළින් බලය ලබාදෙන තුරු රැඳී සිටින ලෙස අණ කිරීමෙන් තහවුරු වන්නේ සභාවේ අත්‍යවශ්‍යය උපකාරය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ බවයි. සභාවේ සැබෑ ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රයෝජනවත් (උපතාර) වන්නාවූ වෙන කිසිවක් නොමැත. සභාව විසින් ඉටු කරන පිණිස පිළිගනු ලබන්නා වූ බොහෝ දේ උන්වහන්සේට අවශ්‍යය නොවේ. සල්පිල් පැවැත්වීම, සමාජශාලා පවත්වාගෙන යාම, විවිධ ආයතන, විනෝද චාරිකා සර්කස් සංදර්ශන පවත්වාගෙන යාම, ශුද්ධාත්මයාණන් වහන්සේට අවශ්‍ය නොවේ. ආගමික මෙහෙයන්, සංවිධානාත්මක ආයතන, කිතුණු සභාව සාදනු ලබන්නේ නැත. පෙන්තකොස්ත දවසේ ගින්නේ දීමනාව නැතිව සභාව සාර්ථකව වැඩෙන්නේ නැත.

ශරීරයේ ජීවය

සභාව තුළ ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාව යේසුස් වහන්සේගේ ඉකුත්වයාමට (ඔසවා ගැනීමට) පෙර සහ අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාවලින් සාක්ෂි සහිතව තහවුරු කිරීමට පෙර පැහැදිලි කර තිබෙන සේක. යේසුස් වහන්සේ උගන්වන්නට සහ කරන්නට යෙදුනාවූ දේවල් සුභාරංචි පොත්වල අපට පවසා ඇත. **"එවිබා තෙයෝපිලස්නි, යේසුස් වහන්සේ තමන් විසින් රෝහාගත් ප්‍රේරිතයන්ට ශුද්ධාත්වය කරුණුකොටගෙන අණදුන් පසු, ඔසවාගනු ලැබූ දවස දක්වා, උන්වහන්සේ විසින් කරන්ටත්, උගන්වන්ටත් පටන් ගත් සියල්ල ගැන ප්‍රථම පොත සවිපාදනය කළෙවි."** (ක්‍රියා 1:1-2) ශුද්ධාත්මයාණන් වහන්සේ, යේසුස් වහන්සේ වෙතට පැමිණීමෙන් පසු උන්වහන්සේ නොකඩවාම කරන්නා වූ දේවල් සහ උගන්වන්නා වූ දේවල් පිළිබඳව ක්‍රියා පොතේ පැහැදිලි කර තිබෙන සේක.

පුත්‍රයාණන් වහන්සේව මහිමයට පත්කිරීමේ ක්‍රියාකාරී සහ පරිපාලන ඒජන්තවරයාණන් ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේ කටයුතු කරන සේක. ඔසවාගනු ලැබූ යේසුස් වහන්සේගේ ක්‍රියාකිරීම නියෝජනය කරන්නා වූ බලයලත් පරාක්‍රමධාරියා ශුද්ධාත්මයාණන් වහන්සේය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ සේවය වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ චරිතය නොකඩවා පවත්වාගෙන යාම, උන්වහන්සේගේ රාජ්‍යය පිහිටුවා පවත්වාගෙන යාම, ලෝකය මුදාගැනීමේ ක්‍රිස්තුස් වහන්සේගේ අරමුණ සම්පූර්ණ කිරීම කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේව මහිමයට පත්කරනු ලැබීම වන සේක. සභාව ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය වන අතර ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මයාණෝය. ක්‍රිස්තුස් වහන්සේගේ සභාව නැමති ශරීරය ශුද්ධාත්මයාණන් වහන්සේ පූර්ණ කරන සේක. උන්වහන්සේ සභාවේ වර්ධනය මඟ පෙන්වන සේක. එහි සාමාජිකයන්ව හසුරවනු ලබන සේක. සභාවට ප්‍රඥාව ලබාදෙන සේක. ශක්තිය සපයා දෙන සේක. උන්වහන්සේ සත්‍ය කරා මඟපෙන්වන සේක. සභාවේ නියෝජිතයන්ව පවිත්‍ර කරන සේක. (කැපකරගන්නා සේක) සාක්ෂි දැරීම සඳහා බලය ලබාදෙන සේක. සභාවේ කාර්යය වන්නේ ආත්මයාණන් වහන්සේට සේවය කරමින්, උන්වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කර, උන්වහන්සේගේ බලය පතුරුවා හැරීමයි. උන්වහන්සේ කැඳවා, ව්‍යාප්ත කරමින්, හසුරුවමින්, මඟපෙන්වමින්, ප්‍රබෝධමත් කරමින්, ශක්තිය ලබා දෙන සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේ, උන්වහන්සේගේ ආධිපත්‍යයේ බලය අත්හැරිය සේක. උන්වහන්සේ, තමන් වහන්සේගේ බලයෙන් සහ තත්ත්වයෙන් පහතට නොපැමිණි සේක. ක්‍රිස්තුස් වහන්සේගේ සභාව තුළ උසස් මන්ත්‍රණ සභා, සම්මන්ත්‍රණ පාර්ලිමේන්තුව හෝ පාප්තුමා උත්තරීතර වන්නේ නැත. දෙවියන් වහන්සේ විසින් පාලනය කිරීම වෙනුවට මනුෂ්‍යයා විසින් සභාව පාලනය කිරීම නිසා එබඳු වූ සභාව අසාර්ථකවී විනාශයට ගොඳුරු වේ. බයිබල් නිසා එබඳු වූ සභාව අසාර්ථක වී විනාශයට ගොදුරුවේ. බයිබල් විද්‍යාල වලින් පුහුණුව ලබා තිබුණත් ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණවූයේ නැති නම් හාස්කම් සිදු නොවේ. සභාවේ කමිටු වැඩි වුවත් යාච්ඤා කිරීම අතපසු කර තිබීම නිසා, සමහර විට අනවශ්‍යය සැරසිලි වලින් පරී, සෝෂාකාරී බවින් පිරී, උත්සහවන්ත වුවත් වැදග ැම්මකට නැති දේවල් උදෙසා ශක්තිය වැය කරමින් නිශ්ඵල සේ වෙහෙසෙති. එහිදී යාන්ත්‍රික විද්‍යාවෙන් විශිෂ්ඨත්වයට පත්විය හැකි අතර උද්යෝගී බවින් අසමත් වී සිටිය හැකිය. එහි සාමාන්‍යය තරමට වඩා අධික වූ ක්‍රියාමාර්ග පවතින්නේය. අවශ්‍යය වන්නේ බලයයි. සංවිධානයක් පවත්වාගෙන යාමට දෙවියන් වහන්සේව අවශ්‍ය නොවේ. මනුෂ්‍යායට ශක්තිය, ව්‍යාපාර සඳහා සූදානම සහ මනුෂ්‍ය කාරණා සඳහා උද්යෝගය සැපයීමට පුළුවන. නමුත් සභාවේ සැබෑ ක්‍රියාවන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය මත රැඳී පවතින්නේය.

සැමුවෙල් වැඩ්වික් විසිනි)

සභාවේ කාර්යයන් සඳහා පධාන වන්නේ සහ අත්‍යවශ්‍යය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වයයි. උපකාර (ප්‍රයෝජනවත්) වන්නා වූ වෙන කිසිවක් නොමැත. උන්වහන්සේගෙන් වෙන් වූ ප්‍රඥාව මෝඩකමයි. උන්වහන්සේගෙන් වෙන් වූ ශක්තිය දුර්වලකමයි. ආත්මික සත්‍යතාවය උන්වහන්සේ එළිදරව් කරන තෙක් මනුෂ්‍යාගේ උගත්කමින් එය තේරුම්ගත නොහැකිය. උන්වහන්සේගේ ආනුභාවය ලැබෙන තෙක් නමස්කාරය රූප වන්දනාවක්ව තිබේ. උන්වහන්සේගේ බලය ප්‍රකාශ වන්නේ නැති නම් දේශනා කිරීම බල රහිත වන්නේය. උන්වහන්සේ බලය ලබාදෙන්නේ නැති නම් යාච්ඤා කිරීම නිශ්ඵලව තිබේ. මනුෂ්‍යයාගේ උපක්‍රම ඉගෙන ගැනීම, සංවිධානාත්මක ක්‍රියාවන්, ධනය, උද්යෝගය, ප්‍රතිසංස්කරණය සහ පරිත්‍යාගශීලීබ වැනි කාරණා ශුද්ධාත්මයාණන් වහන්සේ නොමැති නම් ඒවා නිශ්ඵල දෙයකටත් වඩා ඉතා නරක දෙයක්ව තිබේ.

ආත්ම විශ්වාසය නැමති කාරණයේ දී සභාව බොහෝ විට අසාර්ථක වේ. සභාව එකම ආකාරයක වටරවුමක ගමන් කරන විට එහි සෙනඟ පිරී පැවතුනත් දෙවියන් වහන්සේගේ ෂෙකයිනා මහිමය එහි නැත. යාච්ඤා කිරීම ඇදහිල්ලේ පරීක්ෂණය සහ බලයේ රහස වන්නේ එබැවිනි. ආත්මයෙන් යාච්ඤා කිරීමේ යාච්ඤා ජීවිතය තුළ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ප්‍රසව වේදනාව පවතින්නේය. උන්වහන්සේගේ බලයේ ක්‍රියාව නිතැතින්ම හාස්කම් සිදු කරන්නේය. හාස්කම් නොමැතිව සභාව පැවතීමට නුපුළුවන. ලොකික බව තර්ක කළ හැකිය.
නමුත් ආත්මයාණන් වහන්සේ

2 පිටුවට

1 පිටවෙන්

අපගේ ජීවිතයේ සාර්ථකත්වය...

වරදකරු බව ප්‍රකාශ කරන සේක. අධ්‍යාපනය මනුෂ්‍යයෙකුව ශිෂ්ඨසම්පන්න කළ හැකිය. නමුත් එය හටගන්නේ ආත්මයාණන් වහන්සේගේ මුදාග ැනීම තුළය. මාංශයේ ශක්තියෙන් වෙළඳ සංකීර්ණ පවත්වා ගැනීම, විනෝදය සඳහා සංවිධානය කිරීම, මිලියන ගණන් බලාපොරෝතු වර්ධන කර ගැනීම සිදු නිය හැකිය. නමුත් ජීවමාන දෙවියන් වහන්සේගේ මාළිගාව නිර්මාණය කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වයයි. වර්තමානයේ වපත්තියට මුල් වූ කාර්ය නම් කිතුණුවා සභාවට වඩා වැඩි විශ්වාසයක් ලෝකය කෙරෙහි තැබීම සහ ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට වඩා වැඩි විශ්වාසයක් මාංශය කෙරෙහි තැබීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වය සහ බලය අවබෝධ කර ගැනීමට හැරී යන තෙක් කාරණාවන් හරි ගැස්සෙන්නේ නැත. සතර දිශාවෙන්ම සුළඟ ඇවිත් මැරුණා වූ අයී වමාන විය. වියළුණු ඇට කටු බලවත් හමුදාවක් ලෙස සිටගත්තෝය. නමුත් එය සිදුවූයේ යාච්ඤා කිරීම කරුණු කොටගෙන පමණි.

ආත්මයාණන් වහන්සේගේ බලය සහ ක්‍රියාව

ආත්මයාණන් වහන්සේගේ බලයෙන් උන්වහන්සේගේ පුද්ගලිත්වය වෙන් කළ නොහැකිය. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ ගුණාංග පිට අයට ලබා නොදෙන සේක. උන්වහන්සේගේ බලය කුලියට නොදෙන සේක. එය උන්වහන්සේගේ අභිමුඛත්වයෙන් වෙන් කළ නොහැකිය. උන්වහන්සේගේ වාසය කිරීම කරුණුකොටගෙන ශක්තිය ලබාදෙන සේක. ආත්මයාණන් වහන්සේ අපගේ ආත්මය තුළ සිට ක්‍රියාකරන සේක. උන්වහන්සේ හුදෙක් බලය ලබාදෙන්නා පමණක් නොවේ. උන්වහ්සේ බලය හසුරවන්නා ද වන සේක. වෙන කිසිවෙකුට එය කල නොහැකිය. උන්වහන්සේගේ බලය අප තුළ ක්‍රියාත්මක වීමෙන් දෙවියන් වහන්සේගේ මුළු කැමැත්ත උදෙසා අප සියලුදෙනා බලයෙන් පූර්ණ වන්නේය. බොහෝ විට අපි අසමත් වන්නේ මේ තුළ නොවේද? බලය ඉල්ලා අපි නිතර කරන යාච්ඥා කිරීම්වලදී ආත්මයාණෙන් වහන්සේව ලබා ගැනීමට වඩා අපි ආශා කරන්නේ බලය ලබා ගැනීමට ද ? බලයේ ආත්මයාණන්ට වඩා බලයේ ජයග්‍රහණයට ආශාවීම සිත අවුල් සහගත තත්ත්වයකට පත් නොකරන්නේද ..? අපට ඇසට පෙනෙන්නා වූ ප්‍රතිඵල අවශ්‍යව තිබේ. ප්‍රබොධය ඇතිකරන්නා වූ ආශ්චර්යයන් දැකීම, බලවත් ක්‍රියාවන් දැකීම අවශ්‍ය තිබේ. බලයේ ආත්මය ලබාදෙන්නේ සැමවිටම මේ දේවල් සඳහා නොවේ. සමහර විට දේශනා කිරීම උදෙසා මෙන්ම නිශ්ශබ්දව සිටීමටත් බලය අවශ්‍ය වේ. උසස් ස්ථානවල සිටීමට මෙන්ම තේරුම් ගැනීමට (වටපත ගැනීමට) නොහැකි ස්ථානවල සිටීමටත් බලය අවශ්‍ය වේ. දෙවියන් වහන්සේගේ මුළුකැමැත්ත තුළ සඵලවීමට ආත්මයාණන් වහන්සේ පැමිණ අපව පිළියෙල කරන සේක. එකම ආත්මයාණන් වහන්සේ විවිධත්වයෙන් විද්‍යාමානවීම (ප්‍රකාශවීම) සහ ක්‍රියා කිරීම යන කාරණා දෙක තුළම පවතින සේක.

ආත්මයාණන් වහන්සේගේ බලය මත ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාව රැඳී පවතින සේක. වෙනත් බලයකට එය කළ නොහැකිය. ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාව මාංශයේ ශක්තියෙන් කළ නොහැකිය. උන්වහන්සේගේ බලය වෙනුවෙන් වෙන කිසිවක් ආදේශ කළ නොහැකිය. සියොන් වැසියන් බැබිලෝනීය රන්වලට තදින් ආශා කරන විට, බැබිලෝනියේ ඇඳුම්වලට ඊර්ෂ්‍යයා කරන විට, බැබිලෝනියේ ක්‍රියා මාර්ග අනුගමනය කරන විට බැබිලෝනියේ නමස්කාරයන්ට සහ බැබිලෝනියේ යුධ ආයුධ සමඟ සටන් කිරීමට කැමති වන විට සියොන් වැසියන්ගේ ශක්තිය බිඳවැටේ. මක්නිසාද ආත්මයාණන් වහන්සේගේ බලය අහිමිවී ඇත. ආත්මික කර්තවය තුළ ලෞකික (මාංශික) සම්පත් ප්‍රයෝජනවත් නොවේ. මෙම යුදුධයේ යුද්ධායුධ මාංශික ඒවා නොවේ. යාච්ඤා කිරීමෙන් බලය ගෙන දෙයි. ආත්මයාණන් වහන්සේගේ බලය අහිමි වී ඇත. ආත්මික කර්තව්‍ය තුළ ලෞකික (මාංශික) සම්පත් ප්‍රයෝජනවත් නොවේ. මෙම යුද්ධයේ යුද්ධායුධ මාංශික ඒවා නොවේ. යාච්ඤා කිරීමෙන් බලය ගෙන දෙයි. ආත්මයාණන් වහන්සේගේ බලය ලබා ගැනීම උදෙසා යාච්ඤා කළ යුතුය. සාක්ෂි දැරීම ජයග්‍රහණයේ ආයුධයක් ලෙස තෝරාගනු ලබන අතර සාක්ෂි දැරීම සඳහා ආත්මයාණන් වහන්සේගේ බලය ලබාදෙන සේක. උන්වහන්සේ ගලවා ගන්නේ තර්ක කිරීමේ ක්‍රියාවලියන් තුළින් නොව ජීවමාන අත්දැකීම්වල පුද්ගලික නිශ්චිතභාවයෙන් සහ බලයෙන් සාක්සි දරණ ජීවමාන සාක්ෂිකරුවන් කරුණුකොටගෙ නය. එහිදී ආත්මයාණන් වහන්සේගේ බලය කරුණුකොටගෙන පාපය ධර්මිෂ්ඨකම, විනිශ්චය වටහා දෙනු ලබයි. සබාවේ කාර්යභාරය අස්වාභාවිකව තිබේ. එය මනුෂ්‍යයාගේ ස්වාභාවික ශක්තියෙන් කළ නොහැකිය. එකල ඔහු මට උත්තර දෙමින් සෙරුබ්බාබෙල්ට ස්වාමීන් වහන්සේගේ වචනය මේය. එනම්, බලයෙන්වත් ශක්තියෙන්වත් නොව, මාගේ ආත්මයෙන්යයි සේනාවල ස්වාමීන් වහන්සේ කියන සේක. (සෙකරියා 4:6) එහිදී අසාර්ථකවීම පිළිබඳව සමාවට කරුණු නැත. ඵල රහිතව සිටීම පිළිබඳව සාධාරණීය කිරීමක් නැත. දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනා යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ සෑම ඇදහිලිවන්තයෙකුගේම උරුමය වේ.

ආත්මයාණන් වහන්සේගේ බලය කොතනද ...?

අපෝස්තුළුවරුන්ගේ සභාව තුළ දිව්‍යමය බලයෙන් ඇවිලී තිබීමේ වාතාවරණය පැවතියේය. ඔවුන්ගේ වචන බලය සහිත වූයේය. ඔවුන්ගේ දේශනාව දැඩි විශ්වාසය සමඟ එක්ව ගමන් කළෝය. ලකුණු සහ පුදුම වූ ක්‍රියාවන් තුලින් ඔවුන්ගේ සාක්ෂි දැරීම තහවුරු කළේය. ඔවුන් නපුර කරන්නන්ගේ හදවත් අනාවරණය කරනු ලැබූ අතර ඔවුන්ගේ විනිශ්චයන් ස්වර්ගීය මුද්‍රාව මත තැබුවේය. රාජ්‍ය පාලකයන් ඔවුන් ඉදිරියේ වෙවුළුවේය. මැරුණා වූ අයටත් ඔවුන්ගේ හඬ ඇසුණු විට මළවුන්ගෙන් නැගිටිටෝය. ඔවුන් ස්පර්ශ කළ විට රෝග පහවිය. ඔවුන්ගේ වචනවලට යක්ෂයන් යටත් විය. ආත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වය මනුෂ්‍යයන්ට දිව්‍යමය ලෙස බලය සහ ආධිපත්‍යය ලබා දුන්සේක. ආත්මයාණන් වහන්සේ ඔවුන්ට ඉගැන්වූ බැවින් දෙවියන් වහන්සේගේ සිත ගැන ඔවුන්ට නිසැකකමක් තිබුණේය. ඔවුන් ආත්මයාණන් වහන්සේ තුළ යාච්ඤා කරමින් ඉල්ලූ දේ ලබාගත්තේය. ආත්මයාණන් වහන්සේගේ ශක්තියේ බලවත්කම තුළ ඔවුන් බලවත් ක්‍රියාවන් කරනු ලැබුවෝය. සභාවේ සාමාන්‍ය ජීවිතය ජීවමාන දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය තුළ බලයෙන් සහ ප්‍රබෝධමත්කමෙන් පූර්ණ විය.

එහිදී ශුද්ධාත්මයාණන් වහන්සේ වෙනුවට වෙනත් ආදේශකයක් නොමැත. සභාවට සෑහෙන්නේ මනුෂ්‍යයන්ව නොව නමුත් දෙවියන් වහ්නසේව වන සෙක්. සභාවේ මනුෂ්‍යයන්ගේ ආත්මක ජීවිතය් දිළිඳුකම සාර්ථකත්වය බිඳවැටීමට හේතුවී ඇත. අපගේ සියලු අසාර්ථකවීම්වලට හේතුවී තිබෙන්නා වූ මෙම පොදු මූලාශ්‍රය වෙතින් හැරී ආ යුතුය. සත්‍යතාමයේ සහ ජීවනය ලබා දෙන්නා වූ ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ විශ්වාසය තැබිය යුතුය.

ක්ෂය වූ ආත්මික බලය ඇළුත්කළ හැකිය.

වෙස්ලි එල්. ඩිවෙල් විසිනි (1916-2016)

අපි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වන විට උන්වහන්සේ පවිත්‍රත්වය සහ බලය ලබාදෙන සේක. යම් කෙනෙක් තමාගේ මුළු ජීවිතය ජීවමාන යාගයක්කොට කැප කරන විට ආත්මික ජීවිතයේ අලුත් ප්‍රමාණයකින් පූර්ණවීම සඳහා අයැද සිටීමට නව මානයක් ලබාදෙයි. ශුද්ධාත්මයාණන් වහන්සේ පාපයෙන් නිදහස් කර සහ ඇතුලාන්ත පුද්ගලයාව කලින් කිසිදාක දැන නොසිටි ප්‍රමාණයකින් පවිත්‍ර කරනු ලබන සේක. ඒ මොහොතේම මහත් වූ දිව්‍යමය බලයෙන් පූර්ණ කරන සේක.

යම් කෙනෙක් ආත්මයාණන් වහන්සේගෙ න් පූර්ණ වූ පසු ආත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන පරිදි වචනයේ ආලෝකය තුළ ගමන් කරන විට ඔහු නිරන්තරයෙන් ස්වාමීන් වහන්සේව සතුටු කිරීමට උත්සාහ දරයි. සෑම ක්‍රියාකාරකමකදීම ඔහු තුළ වාසය කරන ශුද්ධාත්මයාණන් වහන්සේ මතරැඳී සිටින අතර උන්වහන්සේ පරීක්ෂා වලින් ජය ගැනීමට ඔහුට හැකියාව ලබාදෙන සේක. ඔහුට ආත්මයාණන් වහන්සේගේ උපකාරය ඇතිව පවිත්‍රකම ආරක්ෂා කර ගැනීමට හැකිවේ. අපගේ හැගීම් පවිත්‍රව තබා ගැනීම කරුණුකොටගෙන ආත්මයාණන් වහන්සේට කීකරුවීම ප්‍රවේසම් විය හැකිය. (1 යොහාන් 3:3) සියලු දේවලට සාක්ෂිකාරයෙක් වෙමින් නපුර ද්වේශ කළ හැකිය. උන්වහන්සේගේ උපකාරය මත රැඳී සිටීම කරුණුකොටගෙන පාපයේ කැළැල් රහිතව නිදොස්ව පැවතීමට පුළුවන. (2 ප්‍රේත්‍රුස් 3:14)
එම නිසා ආත්මික බලය වෙනස්ව තිබේ. ආත්මික බලය ආරක්ෂා කර ගැනීම නිශ්චිතව තබාගත නොහැකිය. ආත්මයාණන් වහන්සේගේ බලය යනු අපගේ ආත්මය තුළට සහ ඒ හරහා ගලායන උන්වහන්සේගේ ශක්තියයි. ශක්තිය වැය වේ. බලය අළුත් කරගත යුතුය. මෙම ආත්මික රහස සෙකරියා 4 වන පරිච්ඡේදයේ ඉතා අලංකාර ලෙස නිරූපණය කරනු ලබයි.

බබිලෝනියේ වහල්කමින් නිදහස්ව පැමිණි පසු දෙවියන් වහන්සේගේ ආලේපලත් මනුෂ්‍යයන් දෙදෙනා වන යොහුවා උත්තම පූජකයා සහ සෙරුබ්බාබෙල් ආණ්ඩුකාරවරයා තුලින්

3 පිටුවට

2 පිටවෙන්

ක්ෂය වූ ආත්මික බලය...

දේව මාළිගාව නැවත ගොඩනැගීමේදී ශක්තිය සහ ධෛර්යය ලබාදීම පිළිබඳව දෙවියන් වහන්සේ සොකරියා අනාගතවකතෘට ලබදීම පිළිබඳව දෙවියන් වහන්සේ සොකරියා අනාගතවකතෘට ඉතා වැදගත් දර්ශනයක් පෙන්වූ සේක. මහත් වූ විරුද්ධවාදීකම් ඉතා වැදගත් දර්ශනයක් පෙන්වූ සේක. මහත් වූට විරුද්ධවාදීකම් ඉතා වදගත් දර්ශනයක් පෙන්වූ සේක. මහත් වූ විරුද්ධවාදීකම් නිසා අවුරුදු විස්සක් දේව මාළිගාවේ වැඩ කටයුතු ප්‍රමාද විය.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ බලයෙන් පර්ණ වූ ප්‍රකාශයෙන් සහතික ලෙස පැහැදිලි ලෙස පැහිදිලි කර මෙසේ පවසන සේක. **"එකල ඔහු මට උත්තර දෙවින්, සෙරුබ්බාබෙල්ට ස්වාමීන් වහන්සේගේ වචනය මේය. එනම්, බලයෙන්වත්, ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙනැක් යයි සේවාවල ස්වීමීන් වහන්සේ කියන සේක."** (සෙකරිය 7:6) සෙකරියා දුටු දර්ශනයේ දී රන් පහන් රුක පහන් හතකින් දැල්වෙමින් තිබෙනවා දෙවියන් වහන්සේ පෙන් වූ සේක. (පහන් සතෙන් ආලෝකයේ සම්පූර්ණත්වය නිරූපණය කරයි.) ජීවමාන ඔලිව් ගස් දෙකකින් ගලා එන ඔලිව් තෙල් පහන් හතට ලබා දෙන්නේය. ඔලිව් තෙල් ගලා එන විට ආලෝකය ලබා දෙමින් පහන් දැල්වෙමින් පවතියි.

දෙවියන් වහන්සේගේ කරුණාව සම්පූර්ණවීම සඳහා ආත්මයාණන් වහන්සේගේ බලය මහත් ලෙස අත්‍යවශ්‍යව තබේ. නමුත් එය පාවිච්චි කිරීමට කරුණු කොටගෙන වැය වේ. අපිට ඊයේ දවසේ ලැබී තිබුණු බලයෙන් අද දවසේ සේවය කිරීමට නුපුළුවන. අතීතයේ ලැබුණා වූ ආශිර්වාදවල සහ හැකියාවන්වල මතකයන් මත සිටිමින් දෙවියන් වහන්සේගේ මුළු අභිප්‍රාය සම්පූර්ණ කළ නොහැකිය. අපි අතීතය තුළ ජීවත්වීම දෙවියන් වහන්සේට අවශ්‍යය කරන්නේ නැත. නුමුත් මොහොතක් පාසා මොහොතක් උන්වහන්සේගේ බලය හිමිකර ගත යුතුයි.

අපගේ ජීවිත තුළ නොරිස්සුව පවතිද්දීත් දෙවියන් වහන්සේ අපව පාවිච්චි කරන දුර්ලභ ඉතා දුර්ලභ අවස්ථාවන් තිබිය හැකිය. සමහර විට බාලාම් සහ සාවුල් රජතුමාව මෙන් දේශනා කිරීමට උන්වහන්සේ පාවිච්චි කරනවා විය හැකිය. නමුත් දෙවියන් වහන්සේගේ නියමය නම් අපි ලබාගෙන තිබෙන්නේ මෙනවාද? ඒවා පමණක් අපට අනිත් අයට දිය හැකි බවයි. දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන්නේ උන්වහන්සේගේ මහිමය උදෙසා අපව පාවිච්චි කිරීමට දිනපතා අපට හැකියාව ලබාදීමට වන සේක. නොරුස්සන ස්වභාවයේ අපගේ ආත්මික තත්ත්වය පවතින විට උන්වහන්සේ අපව බලවත් ලෙස පාවිච්චි කිරීමට යොමු කරවන්නේ නම් ඒඅ පට සමාව ලබාදීම සඳහා පමණක් වේ.

ආත්මික බලය හීනවන්නේ හෝ නැති වන්නේ කෙසේද ?

ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය විශේෂාකාරයෙන් ලබාගන්නා තුරු යේසුස් වහන්සේ උන්වහන්සේගේ සේවය ආරම්භ නොකළ සේක. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. "ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය මක්නිසාද දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක...." (ලුක් 4:18) ප්‍රේතුස් ක්‍රිස්තුස් වහන්සේගේ සේවය සාරාංශයක් ලෙස මෙසේ පැවසීය. "දෙවියන් වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරිය යේසුස් වහන්සේ ආලේප කළ බවත්, දෙවියන් වහන්සේ උන්වහන්සේ සමඟ සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින් ද යක්ෂයා විසින් පිඩා කරන ලද සියල්ලන් සුව කරමින් ද හැසුරුණු බවත්ය." (ක්‍රියා 10:38) යේසුස් වහන්සේ උන්වහන්සේගේ පොළොවේ සේවයේ දී පාවිච්චි කළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ එම බලයම අද දවසේ සේවයේ දී අපිත් පාවිච්චි කළ යුතුය. ලුක් 6:19 වන පදයේ පැහැදිලි කරන්නේ මෙසේය. **"උන්වහන්සේගේ ආනුභාවය නික්මවින් ඔවුන් සියල්ලන් සුව කළ බවින් වුළු සමූහයා උන්වහන්සේට අතගසන්ට උත්සාහ කළෝය."** (ලුක් 6:19) මෙය ආත්මයාණන් වහන්සේගේ බලයයි. අවුරුදු දොළහක් ලේ යෑමේ රෝගයෙන් පීඩාවිදි ස්ත්‍රිය යේසුස් වහන්සේගේ සළුවේ දාවල්ලට අත ගැසූ විට උන්වහන්සේ මෙසේ කී සේක. කවුරු නමුත් මම අතගැසුවේය. **මක්නිසාද මාගෙන් ආනුභාවය නිකුත් වූ බව මට දැණුනේ යයි කී සේක."** (ලුක් 8:46) යේසුස් වහන්සේ ගැන සත්‍ය වූ දේ ඔබ සම්බන්ධයෙන් ද සත්‍යව තිබේ. ඔබ මනුෂ්‍යයන් අතරේ සේවය කරන විට ආත්මික බලය වැයවේ. දෙවියන් වහන්සේ ඔබව පාවිච්චි කිරීමට අවශ්‍ය නම්, මනුෂ්‍යයන්ගේ තුවාල සුව කිරීමට ඔබට උමනා නම් දෙවියන් වහන්සේගේ බලය නොකඩවා ඔබ තුළ පැවතිය යුතුය. එමෙන්ම එය ඔබ තුලින් ගලා යා යුතුය.

ඔබගේ ආත්මික සේවය කරුණුකොටගෙන ආත්මික බලය ස්වභාවිකවම වැයවේ.

ඔබ වැඩියෙන් සේවය කරන විට වැඩියෙන් බලය අළුත් කරගත යුතුය. ඔබ වඩාත් කාර්යබහුල වන්නේ නම් වැඩියෙන් ඔබගේ බලය අළුත්කර ගැනීම අවශ්‍ය වේ. ආත්මක ප්‍රබෝධකර ගැනීම සහ නැවත අළුත්කර ගැනීම වඩා වැඩියෙන් අවශ්‍යව තිබේ. එය ඔබ අත්විඳින මානසික තෙහෙට්ටුව (විඩාව) හෝ කායික විඩාව නිසා හෙම්බත්වීම නොවේ. ඔබගේ ආත්මික ජීවිතය තුළ අළුත්වීමක් නොමැතිව ඔබ ආත්මිකව සිටියි.

වරක් ලුතර්ගෙන් ඊළඟ දවසේ සැලැස්ම කුමක්ද කියා ඇසූවිට, වැඩ..., වැඩ,,,, අළුයම සිට රාත්‍රිය ඉකුත්වන තෙක්ම වැඩ කියා ඔහු පිළිතුරු දුන්නේය මට බොහෝ වැඩ කරන්නට තිබෙන නිසා දවසේ පළමු පැය තුන යාච්ඤා කිරීමට වැය කරන්නෙමියි කීවේය. ප්‍රමාණවත් යාච්ඤා කිරීමක් නැතිව කාර්යබහුල සේවයක් කිරීමටවත්, ආත්මික බලය වෙතට යොමුවන්නේ නැතිව ආත්මික අළුත්වීමක් ලබා ගැනීමටවත් නුපුළුවන. අපගේ වැය කිරීම අපතේ නොයා යුතුය. ඔබ අනිත් අය වෙනුවෙන් ඔබගේ ජීවිතය වැය කරද්දී ඔබ ආත්මිකව ක්ෂය වෙනවාද ... ? නැවත වරක් දෙවියන් වහන්සේගේ බලය ඔබ මත තිබෙන බවත්, උන්වහන්සේගේ ආලේපය වෙනදාටත් වඩා ඔබ තුළ පවතින බවත් ඔබ අවබෝධ කරගන්නවාද ?

ආත්මික නොවන කටයුතුවලට සම්බන්ධවීමෙන් ආත්මික බලය වැය වේ.

අපි ජීවත් වන්නේ ලෞකිකත්වය මත පදනම් වූ ලෝකයකයි. අපි ජීවත්වන්නේ තනි වූ දූපතක නොව නමුත් සියලු ආකරයේ මනුෂ්‍යය සම්බන්ධකම් පවතින ලෝකයක වේ. අපි හුදකලාවී ජීවත්වීම දෙවියන් වහන්සේට අවශ්‍ය නොවේ. එමෙන්ම අපගේ ජීවිත දූෂිත බලපෑමෙන් හුදකලාවීම ද දෙවියන් වහන්සේට අවශ්‍ය නොවේ. අපි මේ ලෝකයට ලුණු සහ ආලෝකය විය යුතුය. දැල්වීම කරුණුකොටගෙන ආලෝකය ගෙන එන මූලාශ්‍රය වැයවේ. පාවිච්චි කිරීම කරුණුකොටගෙන ලුණු වැය වේ.

මෙහිදී ආත්මික බව සහ වැඩ කිරීම අතර විරද්ධවාදීකමක් නැත. හොඳ කිතුණු සේවකයෙක් මහන්සි වී වැඩකරන කෙනෙක් සහ යාච්ඤාවේ වීරයෙක් වේ. මහත් වූ ආශිර්වාදයක්වීමට බොහෝ මනුෂ්‍යයන් අලසව සිටියි. මිලය ගෙවීම සඳහා දෙවියන් වහන්සේගේ වචනයට සහ යාච්ඤා කිරීම කාලය සොයා ගැනමට තමන්ගේ ජීවිත හික්මවා ගන්නේ කෙසේදැයි අවබෝධ කරගන්නේ නැත. ඔවුන් ආත්මිකව නැවත අළුත්වීමට වඩා ඕනෑම දෙයකට පාහෝ ප්‍රමුඛත්වය ලබාදෙයි. සෙකරියා 4 වන පරිච්ඡේදයේ පහදා දෙන්නා වූ කාරණා ඔවුන් ඉගෙන ගන්නේ නැත. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන සාර්ථකවීමට වඩා තමන්ගේ ශක්තියෙන් සාර්ථකවීම ඔවුන් උත්සාහ කරන්නෝය.

බොහෝ ආකාරයේ වැඩවලදී යාච්ඤා කිරම් ප්‍රශංසාවන්, ආත්මික සම්බන්ධතාවයන් සහ ස්වාමීන් වහන්සේ කෙරෙහි ප්‍රේමය ප්‍රකාශ කිරීමේ අවස්ථාවන් සඳහා උපදෙස් ලබාදීමේ අපූරු අවස්ථා තිබේ. නමුත් බොහෝ විට අපි ජීවත්වන්නේ ස්වාමීන් වහන්සේ අපේ පැත්තේ නොසිටින ලෙයසි. අපි උන්වහන්සේව නොසලකා හැර ඇත්තෙමු. අපි පඅගේ කල්පනාව (මනස) මනඃකල්පිත දේවලින් තමා ගැනම අනුකම්පාවෙන්, තමාගේම උත්සාහයෙන් දියුණුවීමේ සැලසුම් වලින් පුරවාගෙන තිබේ. සියලු ආකාරයේ වැඩවලදී දෙවියන් වහන්සේ සමඟ ඒ අවස්ථාවලට යොමුවීමට අපට හැකිය. නමුත් මෙය වඩාත් අපහසු ක්‍රියාකාරකම් හෝ වාතාවරණයන් වී තිබේ. සමහර ස්ථානවල වාතාවරණය හසුරුවන්නේ ආත්මික ක්‍රියාකාරකම් නොව ආත්මික විරෝධී තත්ත්වයන්ය. සෝෂාකාරී බව, බැරෑරුම් දේ සැහැල්ලුවෙන් සැලකීම, කේන්ති අවුස්සන, පාපිෂ්ඨ විහිළු කරන, භෞතික වාදය පවතින හෝ කිසිඳු බලපෑමකින් තොරව දෙවියන් වහන්සේගේ නාමය අවමානයට ලක් කරන, නිරතුරුවම ස්වාමීන් වහන්සේ නැති වාතාවරණයන්වල ඔබට පැවතීමට නුපුළුවන. එසේ සිටින්නේ නම් ඔබගේ ආත්මික බලය ක්‍රමක්‍රමයෙන් නැතිවී යන්නට පටන් ගන්නා බව ඔබට හැගෙනවා ඇත. ලොක්ට මෙන් නිරන්තරයෙන් දැඩි වේදනාව සහ හිංසාව ඔබට හැගෙනවා ඇත. (2 ප්‍රේතුස් 2 : 7-8)

ඔබගේ ජීවිතයට අවශ්‍ය ආත්මික සම්බන්ධතාවය සහ අළුත්වීම උදෙසා නිශ්චලව සිටීම අවශ්‍ය වේ. සමහර අය රූපවාහිනියට හෝ ගුවන්විදුලියට ඇබ්බැහිවී විනෝදාශ්වාදය විඳින නිසා ආත්මයේ අළුත්වීම, ප්‍රබෝධමත්වීම උදෙසා නිශ්චල කාලය ගතකරන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට නොහැකිව සිටිති. බයිබලීය කාලයේ දී සම්මුඛවීමේ කුඩාමේ හෝ දේවමාළිගාවේ සේවය කිරීමට පෙර පූජකයා තමාවම පවිත්‍රකරගනු ලබන්නේය. ආත්මිකව ශුද්ධාත්මයාණන් තුළ පැවතීම හෝ පවිත්‍රවීමත්, ස්වාමීන් වහන්සේ සමඟ නිරන්තරයෙන් පැවතීමත් අපට අවශ්‍යව තිබේ.

අනිත් කිතුණුවන් සමඟ එක්සත්කම නැතිවිට අපගේ ආත්මික බලය හීනවන්නේය.

එක්සත්කම ආත්මික ප්‍රබෝධය සහ ආශිර්වාදය ගෙන එන්නා වූ ස්වර්ගයෙන් වැටෙන පිණි මෙන් වන්නේ යැයි දාවිත් පැවසුවේය. (ගීතාවලිය 133:3) එක්සත්කම නොමැතිවීම ඊට ප්‍රතිවිරුද්ධව තිබේ. එය ආත්මය වියලීමට, ආත්මික ජීවිතය පරිහානියට පත්වමට, ආත්මික ජීවිතයේ ප්‍රබෝධමත්වීම සහ උද්යෝගිමත් බව ඇතිවීමට තිබෙන ධෛර්යය සිදීයාමට සලස්වන්නේය. විවේචනාත්මක ආකල්ප නොරුස්සන සිතුවිලි, ඕනඋම සමාව නොදමේ තත්ත්වයක් හෝ හදවතේ පවතින තිත්තකම කරුණුකොටගෙන බලය නැතිවී යන්නේය. අනිත් අයගේ කාරුණික සිතුවිලිවලට වඩා වේගයෙන් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය, බලය, ආලේපය ඔබගේ ජීවිතයෙන්

4 පිටුවට

"කැළලක්වත්, පළුද්දක්වත් නැති බැටළු පැටවෙකුගේ ලේ වැනි වූ ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ ලෙස කරුණුකොටගෙන බව නුඹලා දන්නහුය. " (1 ප්‍රේතුස් 1:19)

3 පිටවෙන්

ක්ෂය වූ ආත්මික බලය...

ඉවත්කර දමන්නේය. සෙනෙහවන්තකමක් නැති වචන ඕපාදූප, අනිත් අයගේ හාස්‍යයට ලක්කිරීම සහ පරාජිතව කථා කිරීම ඔබගේ ජීවිතයෙන් දෙවියන් වහන්සේගේ බලය සහ උන්වහන්සේගේ අභිමුඛත්වයේ ඇති මිහිරියාව කපා හැරීමට හේතු වන්නේය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ප්‍රේමයට ලෙහෙසියෙන්ම රිදවන්නා වූ ඕනෑම විරුද්ධාවදීමක් ආත්මික බලය විනාශ කර දමන්නේය.

ශුද්ධාත්මයාණන් වහන්සේව වේදනාවට පත්වන්නේ මොනවායින්ද්‌දැයි කියා ඉක්මනින් අවබෝධකරගැනීමට ප්‍රමාණවත්හැඟීමකින්සිටිනවාද ... ? දෙවියන් වහන්සේගේ සෙනගට අතගසන්නා වූ ඕනෑම කෙනෙක් දෙවියන් වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාවට අතගසන්නේය. (සෙකරියා 2:8) ඔබ කරන්නා වූ එක විවේචනාමත්මක ප්‍රකාශයකින් පැය ගණනකින් ඔබට ලැබුණු ආශිර්වාදය විනාශකර දැමිය හැකිය. ශුද්ධාත්මයාණන් වහන්සේ සම්පූර්ණ ප්‍රේමයේ ආත්මයාණන් වහන්සේය. උන්වහන්සේගේ එක් කාර්යයක් වන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වලට සහ සිතුවිලි වලට වැගිරවීමයි. (රෝම 5:5) උන්වහන්සේගේ සෙනෙහෙවන්ත ස්වභාවය අපට හෙළා දැකීමට (දුක් කිරීමට) නුපුළුවන. මෙම කාරණය ගැන පාවුල්තුමා තියුනු ලෙස සහ තදින් පවසා තිබේ. **"එසේ නම් නුඹ නුඹේ සහෝදරයා විනිශ්චය කරන්නේ මක්නිසාද ... ? නොහොත් නුඹ නුඹේ සහෝදරයා කුමක් පිණිස සුළුකොට සිතන්නෙහිද ... ? මක්නිසාද අපි සියල්ලෝම දෙවියන් වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිටින්නෙමුව."** (රෝම 14:10) **"අනිකෙකුගේ වැඩකාරයා විනිශ්චයකරන්නාවූ නුඹ කවුද? ඔහු සිටියත් වැටුණත් ඒක අයිති තමාගේම ස්වාමියාටය. එසේය, ඔහු සිටුවනු ලබන්නේය. කුමක් හෙයින්ද ඔහුව සිටුවන්ට ස්වාමීන් වහන්සේම බලය ඇත්තේය."** (රෝම 14:4) **විනිශ්චය** කිරීම් සිතුවිලි සෑමවිටම ශුද්ධාත්මයාණන් වහන්සේව වේදනාවට පත්කරනු ලබන්නේය. **"දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේට දුක් නොදෙල්ලා මක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රාකරනු ලැබුවහුය. සියලු නින්තකමත්, කෝපයත්, උදහසත්, කෝලහලත්, අපහසාත්, සියලු ක්‍රෝධත් නුඹලා කෙරෙන් පහකරනු ලැබේවා. නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිට ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ නුඹලාට කමාවුණ ලෙසම නුඹලත් එකිනෙකාට කමාවෙයල්ලා. එබැවින් නුඹලා ප්‍රිය දරුවන් මෙන් දෙවියන් වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා ක්‍රිස්තුස් වහන්සේ නුඹලාට ප්‍රේමකොට මිහිරි සුවඳක් පිණිස දෙවියන් වහන්සේට පූජාවක් ද, යාගයක් ද කොට අප වෙනුවට තමන්ම පාවා දුන්නාක් මෙන්ම නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා."** (එපීස 4:30- 5:2)

කීකරුකම නොමැතිවීම ආත්මික බලය හීනකරනු ලබන්නේය.

දෙවියන් වහන්සේගේ ආලෝකය තුළ නොකඩවා ගමන් කිරීම අසාර්ථකවීම හෝ දෙවියන් වහන්සේ ලබා දී තිබෙන අවස්ථාව පිළිගැනීමට හා භාවිතා කිරීමට අපොහොසත්වීමෙන් ආත්මයාණන් වහන්සේගේ බලය අහිමි විය හැකිය. යේසුස් වහන්සේ උදෙසා වැඩිපුර කාරණා ඉටු කිරීමට නිශ්චිතවම දෙවියන් වහන්සේ අපට අවස්ථාව ලබා දී තිබෙන සේක. එය අපට කරන ආයාචනයක් නොවේ. එය රදා පවතින්නේ අපි කොපමණ දැඩි ලෙස යේසුස් වහන්සේට ප්‍රේම කරනවාද ?, ප්‍රේමයේ කුඩා ඉරියව්වලින් පවා උන්වහන්සේව සතුටු කිරීමට අපි කොයිතරම් ආශාවෙන් සිටිනවාද යන්න මතයි. ඔබ උන්වහන්සේට කරන්නා වූ ප්‍රේමයේ ක්‍රියාකාරකම්වල හැඟීම් වර්ධනය වන විට උන්වහන්සේ ඔබගේ ජීවිතය සමීපයේ සිට ආශිර්වාද කරන සේක. උන්වහන්සේට ප්‍රේම කිරීමට යොමුවීම නොසලකා හරින විට උන්වහන්සේගේ අභිමුඛත්වයේ පිඹීදීමේ මිහිරියාව නැතිවී යන්නේය.

ආත්මික සැලකිලිමත්කමක් නැතිව ක්‍රියා කරවා හෝ වචන තුළ සිතුවිලි තුළ, ඔබගේ ප්‍රේමය ප්‍රකාශ කිරීමට යොමුවීම අසාර්ථක වන විට ඔබ මත තිබෙන ආත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වය සහ බලය පිරිහෙන බව ඔබට අනතුරු අඟවන සේක. ඔබගේ සෙනෙහෙවන්ත මිතුරාව සතුටු කරන ලෙස ස්වාමීන් වහන්සේව සතුටු කරන්නේ කෙසේද කියා සංවේදීව සිටිනවාද .. ? කීකරුවීමට ප්‍රමාද වන විට ආත්මයාණන් වහන්සේගේ යෝජනාවන් ප්‍රතික්ෂේප කරන විට ඔබගේ හදවතේ ඕනෑම මතභේදයක් ඇතිව ඔබ උදෙසා ඇති ස්වාමීන් වහන්සේගේ උසස් වූ කැමැත්ත වළක්වන විට (විරුද්ධ වන විට) මේ දේවලට ඔබගේ ජීවිතයේ දෙවියන් වහ්නසේගේ බලය ගලා යාමේ සීමාව කෙටි කළ හැකිය. දෙවියන් වහන්සේගේ ආත්මික නියමයන් කරුණුකොටගෙන නිශ්චිතවම ආත්මික බලය පාලනය වේ. දෙවියන් වහන්සේගේ ස්වභාවික නියමයන් කරුණුකොටගෙන ත්‍රාෂ්ටික බලයත් පාලනය කරනු ලබයි.

ආත්මාර්ථකාමී බවට සැපෙහි ගැලී සිටීමට (අලස, අසංවර) සුඛෝපභෝගී ජීවන රටාවට ඔබගේ ආත්මික බලය ක්ෂය කිරීමට පුළුවන.

ආර්.ඒ. ටෝරි බයිබල් ගුරුවරයෙක් සහ ඩී.එල්. මුඩිගේ සහකාර සේවකයෙකි. ඔහු දැඩි ලෙස ඒත්තු ගන්වමින් මෙසේ ලියුවේය.

"ආත්මාර්ථකාමී බව බලය හීනකර දමයි. දෙවියන් වහන්සේගේ බලය යම් කෙනෙක්ට ලබා ගැනීමට යොමුවීමට අවශ්‍ය නම් ආත්ම පරිත්‍යාගයේ යුතුව සිටිය යුතුය. යම් මනුෂ්‍යයෙක් සුඛෝපභෝගී ජීවිතයකට යොමුවන්නේ නම් ඔහුගේ වුවමනා ප්‍රමාණයට වඩා ආශාවෙන් නැඹුරු වෙනවා නම් ආත්මාර්ථකාමීත්වය ව්‍යාප්තවීමතුළ දෙවියන් වහන්සේගේ බලයේ මිහිර සහ ප්‍රීතියේ පූර්ණත්වය අත්විඳිය හැකි යයි මම විශ්වාස නොකරමි. මාංශය පිනවීම සහ ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීම එකට ගමන් කරන්නේ නැත. "

ආත්මයාණන් වහන්සේගේ බලය අපි නොකඩවා අවබෝධ කර ගැනීමට නම් අපගේ ජීවිතයේ සරල චාම් බව ආරක්ෂා කර ගැනීම යොමු විය යුතුය. ආත්මාර්ථකමින්, අධික තෘප්තියෙන් මිදී දුක්විඳීමට පංගුකාරයෙක් විය යතුය. "ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ යහපත් හේවායෙකු මෙන් දුක්විඳීමට පංගුකාරයෙක් වෙයන්න. " (2 තිමෝති 2:3) සුකෝපබෝගී ජීවිතයක් ගතකිරීම ගැන මම අවංකව පසුතැවිලි වන්නෙමි. මම පාපයට මෙන් එයට භය නොවෙමි. නමුත් එය ඊළඟට එන්නේ හීතියේ වස්තුවක් ලෙසින්ය. එය ඉතා සියුම්ය. (වටහා ගැනීමට අපහසුය.) නමුත් සතුරාගේ එම බලය ප්‍රබලව තිබේ. එවැනි අශුද්ධාත්ම දුරුකිරීම උදෙසා නිරාහාරව යාච්ඤා කළ යුතු යැයි යේසුස් වහන්සේ පැවසූ සේක. **"උන්වහන්සේ ගෙට පැමිණි කළ උන්වහන්සේගේ ගෝලයෝ කථාකොට ඒ ආත්මය දුරුකරන්ට අපට බැරිවුණේ මක්නිසාදැයි රහසින් උන්වහන්සේගෙන් විචාළෝය. උන්වහන්සේ යාච්ඤාවෙන් මිස වෙන ආකාරයකින් මේ ජාතිය දුරුකරන්ට නුපුළුවනැයි ඔවුන්ට කී සේක."** (මාර්ක් 9:28 - 29)

ශුද්ධාත්මයාණන් වහන්සේ දේව දරුවන් වෙත සමීපවන අතර සමස්ත සභාවේ සහ ලෝකයේ සුභසාධනය සඳහා සැමවිටම සංවේදී වේ. ආත්මාර්ථකාමී බව සැමවිටම ක්‍රිස්තුස් වහන්සේව කේන්ද්‍ර කර ගැනීමට සහ දේවරාජ්‍යය කේන්ද්‍ර කර ගැනීමට ප්‍රතිවිරුද්ධව තිබේ. කිතුණුවන් බොහෝ ක්‍රියා මාර්ගවලදී ඔවුන්ගේ කාලය වැය කරනවා හෝ නිදහසේ තම ආශාවන්වල ගැලී සිටීම තුළ පවතින්නේය. එසේ නති නම් ශුද්ධකමේ පූජාවීමේ ආත්මයට සහක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍යය පැතිරීමටත්, වේදනාවට පත්ව සිටින ලෝකය හඳුනා ගැනීමටත් පටහැනිව ක්‍රියා කරයි. උන්වහන්සේගේ පරම්පරාවේ අයට පැවසූ ලෙසම අපගේ පරම්පරාවේ අයට පවසන ලෙස ඉවැන්ජලිස්ත කිතුණුවන්ට කියනු ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ආශිර්වාද කිරී සමඟ උන්වහන්සේගේ බලය පිටාර ගලායාමට සලස්වා තිබෙන විට උන්වහන්සේ සැලකිලිමත් වන දේවල් අප නොසලකා හරින්නේ කොහොමද ..?

උඩඟුකම සහ අහංකාරය ආත්මික බලය ක්ෂයකර දමයි

උඩඟුකම තුලින් බලය ක්ෂණිකවම මුළුමනින්ම නැතිකර දැමමට පුළුවන. දෙවියන් වහන්ස් උන්වහන්සේගේ මහිමය වෙන කිසිවෙකු සමඟ බෙදාගන්නේ නැත. තත්ත්වය නොසලකා නිහතමානී වන ආත්මයෙන් පූර්ණ වූ මනුෂ්‍යයන් තුලින් ක්‍රියා කරන සේක. දෙවියන් වහන්සේට පමණක් යෝග්‍ය වූ මහිමය යම් කෙනෙක් තමාට ලබාගෙන උඩඟුවන්නේ නම් දෙවියන් වහ්නසේ උන්වහන්සේගේ බලය වහාම අයින් කරන සේක. උඩඟුකම සාතන් ඔබව පරීක්ෂාවට ලක් කරන එක නිශ්චිත කාරණයකි.

බිලි ග්‍රැහැම් නැවත නැවත එය ප්‍රකාශ කරන්නේය. ඔහු මෙසේ කීවේය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ යස්තය මා පිට තැබීමෙන් ඉවත් කළොත් මේ තොල් මැටි තොල් බවට පත්වේ. අපි පොළොවේ භාජන පමණි. "නුමුත් ඒ බලයේ උතුම්කම අපට නොව දෙවියන් වහ්නසේට අයිතිවන පිණිස මේ වස්තුව අපි මැටි භාජනවලට දරමුව. (2 කොරින්ති 4:7) දෙවියන් වහන්සේ වෙන කිසි මනුෂ්‍යයෙකුට වඩා මෝසෙස් සමඟ මුහුණට මුහුණ සම්බන්ධතාවය පවත්වා ගනිමින් උන්වහන්සේව සම්පූර්ණයෙන් අනාවරණය කළ සේක. ඒ තුළින් වෙන කිසි මනුෂ්‍යයෙකුට වඩා බලවත් හාස්කම් කළ සේක. (ද්විතිය කථාව 34:10,12) මක්නිසාද මෝසෙස් පොළොවේ අන් කිසිවෙකුට වඩා යටහත් පුද්ගලයෙක් වූ සේක. (ගණන් කථාව 12:3)

උස්සියා රජතුමා දෙවියන් වහන්සේගේ උපකාරය කරුණුකොටගෙන ශක්තිමත් විය. එමෙන්ම ඔහුගේ උඩඟුකම වර්ධනය විය. (2 ලේකම් 26 : 15-16) බොහෝ කිතුණු නායකයන්ගේ ඉතිහාසය ලියවී තියෙන්නේ ඒ වචන ආකාරයටම වේ. හෙසතියා රජතුමාගේ විශ්වාසය මත දෙවියන් වහන්සේ බලවත් ලෙස ක්‍රියා කළ සේක. නුමුත් ඔහුගේ යාච්ඤාවලට පිළිතුරු ලැබීම නිසා විශ්වාස කළ නොහැකි ලෙස ඔහුගේ සිත උඩඟු විය. (2 ලේකම් 32:25) දෙවියන් වහ්නසේ පාවිච්චි කරන තෙක් නෙබුකද්නේශර් රජතුමා ගෞරවයෙන් සිටියේය. නුමුත් ඔහු උඩඟු විය. (දානියෙල් 5:20)

ලුසිෆර්ගේ උඩඟුකම නිසා ඔහුව පහතට හෙළනු ලැබීය. (එසකියෙල් 28:2,5,17, 1 තිමොති 3:6) උඩඟුකම අපව ක්‍රිස්තුස් වහ්නසේගේ ස්වරූපයට වඩා සාතන්ගේ ස්වරූපයට සාදනු ලබයි. උඩඟුකම හේතුවෙන් දෙවියන් වහ්නසේගේ මුහුණ අනේ සඟවාගනු ලබන සේක. දෙවියන් වහන්සේ උඩඟුවූවන්ට විරුද්ධව සිටින අතර යටහත්වූවන්ට කරුණාව දක්වන සේක. (යාකොබ් 4:6, 1 ප්‍රේතුස් 5:5) අහංකාර ඕනෑම පියවරක පළමුවන පියවර උඩඟුකමයි. තමන් වෙනුවෙන් කරන ඕනෑම පිළිගැනීම දෙවියන් වහන්සේට ලැබිය

5 පිටුවට

4 පිටවෙන්

ක්ෂය වූ ආත්මික බලය...

යුතු ප්‍රශංසාව ප්‍රතික්ෂේප කිරීමක් විය හැකිය. දෙවියන් වහන්සේගේ උපකාරයේ පදනම ම සිටින්නේ නම් සහ අපි උන්වහන්සේ මත සම්පූර්ණයෙන්ම යැපෙමින් සිටින්නේ නම් අපගේ ආත්ම විශ්වාසය නිහතමානී විය හැකිය. නමුත් ලෞකික දේවල් කෙරෙහි ආත්ම විශ්වාසය තබා ගනිමින් තමාගේම හැකියාවන් , දක්ෂතාවයන් මත විශ්මාසය තබන්නේ නම් එය දෙවියන් වහන්සේගේ මිරිහි වූ අභිමුඛත්වය සහ උන්වහන්සේගේ මහත් වූ බලය අපෙන් කොල්ල කනවා ඇත.

ගැඹුරු නිහතමානීකමකින් සලකුණු ගෙනවන කෙනෙකුගේ දේව සේවය තුළ ප්‍රකාශ වන ඕනෑම බලයක් වයාජ බලයකි. එය දෙවියන් වහන්සේගේ බලය නොවේ. එය මානසික බලයක් විය හකිය. එය ආලෝකයේ දූතයෙකු මෙන් පෙනී සිටීමට ප්‍රියා කරන සාතන්ගේ බලය විය හැකිය. (2 කොරින්ති 11:14)

(7) බැරෑරුම් දේ ඕනෑවට වඩා සැහැල්ලුවෙන් සැලකීම ආත්මික බලය ක්ෂය කර දමන්නේය.

හාස්‍යය ඉපදවීමේ හැකියාව දෙවියන් වහ්සේ අපට ලබා දී ඇති දීමනාවකි. නමුත් එය භාවිතා කළ යුත්තේ සුදුසු ආකාර වලින් සහ නිහතමානී ප්‍රමාණයකට පමණි. පැහැදිලිවම දෙවියන් වහන්සේ යහපත් හාස්‍යය භුක්තිවිදින දෙවියන් වහන්සේය. උන්වහන්සේ අපට සිනහවීමට හැකියාව සහ මාස්‍යය තුළ සතුටුවීම නිර්මාණය කර තිබෙන්නේ එය නිසාය. නමුත් එයට වෙලාවක්, ස්ථානයක්, දෙවියන් වහන්සේගේ කැමැත්ත මත සීමාවක් තබා තිබෙන සේක. ඕනෑවට වඩා කරන යහපත් හාස්‍ය පවා දෙවියන් වහන්සේගේ බලය හීනකර දමයි. විශේෂ ආත්මික වගකීමකට මොහොතකට පෙර එය ඉදිරියේ සිටන බව මා අවබෝධ කර නොගෙන සිටියද අපි ආත්මිකව සූදානම් විය යුතු ඒ සමහර අවස්ථාවලදී සාතන් මාව සහ අනිත් අයව විනෝදයට පත්කිරීමට උත්සාහ දරන බව මම දැක ඇත්තෙමි. අත්මික අර්බුදයකට හෝ දෙවියන් වහන්සේගේ බලය බොහෝ සෙයින් අපට අවශ්‍ය වන අවස්ථාවලට පෙර සාතන් එය අපෙන් උදුරා ගැනීමට සතුටු වන්නේය. පැය ගණනාවක් කරන යාච්ඤාවකින් ලැබෙන දේව අභිමුඛත්වය සහ උන්වහන්සේගේ බලය විනාඩි පහකදී කරන නුසුදුසු හාස්‍යයකින් හෝ නුසුදුසු වෙලාවක කරන හාස්‍යයකින් නැති විය හැකිය.

(8) පාපය සෑම විටම අප තුළ ඇති ආත්මයාණන් වහන්සේගේ බලය ක්ෂය කරමින් විනාශකර දමනු ලබන්නේය.

දැන දැනම කරන අකීකරුවීම අලෝකයට එරෙහි පාපය, තවත් කෙනෙකුට විරුද්ධව කරන පාපය, දෙවියන් වහ්නසේගේ ආලෝකය තුළ ගමන් කිරීමට අපොහොසත්වීම, දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සහ උන්වහන්සේගේ අනුග්‍රහය මත ගෙන එන සිනහව නවතා දමනු ලබයි. පාපය විසින්, ආත්මයාණන් වහන්සේගේ බලයෙන් පූර්ණවීමසහ ඔබව ආත්මයාණන් වහන්සේගේ බලයෙන් පාවිච්චි කරනු ලැබීම නතර කර දමනු ලබයි. පාපය විසින් යාච්ඤා කිරීමෙන් ලැනෙ ප්‍රතිඵලය සොරාගනු ලබයි. **"අයුතුකම් කිරීමේ අභිප්‍රායක් මාගේ සිතෙහි ඇත්නම්, ස්වාමීන් වහන්සේ මාගේ බස් නාසන සේක."** (ගීතාවලිය 66 : 18) ඇත්තටම 1 යොහාන් 3:4 වන පදයට අනුව එයින් අදහස් කරන්නේ පැහැදිලි ආලෝකයක් තිබිය**දීත්** හිතාමතාම දෙවියන් වහන්සේගේ නියෝගය කඩ කිරීමකි. ඊශ්‍රායෙල් සෙනඟ දෙවියන් වහ්නසේට අකීකරුවී දෙවියන් වහන්සේ සමඟ තිබූ ගිවිසුම කඩ කළ නිසා දෙවියන් වහ්නසේ ඔවුන්ගේ කඳුළු සහ යාච්ඤාවන් නොසැලකූ සේක. (ද්විතිය කථාව 1:45) සැමිසන් අකීකරුකම සහ පාපය සුළුකොට සැලකූ නිසා ඔහුට ඔහුගේ කොණ්ඩය සහ දෙවියන් වහන්සේගේ බලය අහිමිවූවා සේම තමන්ගේ ජීවිත මත තිබූ දෙවියන් වහන්සේගේ බලය සම්පූර්ණයෙන්ම නැති කරගත් කිතුණු සේවකයන්ද සිටිති. සමහර අවස්ථාවලදී අපි ස්වාමීන් වහන්සේට අකීකරුවීම පිළිබඳව නොදැන සිටියත් සමහර ක්‍රියා මාර්ගවලදී ආත්මයාණන් වහන්සේව දුක්කර ඇති බව අපගේ හදවත්වලට හැගෙන්නේය. සාතන් මෙම කාරණා මත වරද තබමින් පීඩනයට ලක් කිරීමට සහ අධෛර්යය කිරීමට උත්සාහ දරති. අනිත් අතට මෙය ආත්මයාණන් වහන්සේ වළක්වනවා විය හැකිය. ආත්මයාණන් වහන්සේ කොයි තරම් ප්‍රේමණීය සහ විශ්වාසන්තද කියනවා නම් අපි සම්පූර්ණයෙන්ම නොදැනුවත්ව උන්වහන්සේව දුක්කරන්නේ නම් උන්වහන්සේ අපට කථා කරනවා හෝ අපව ස්පර්ශ කරන සේක. අප දෙවියන් වහ්නසේගේ මඟපෙන්වීමට ඇහුම්කන්දීම වර්ධනය කරගන්නේ නම් අපගේ අවධානය ලබා ගැනීමට සහ විශ්වාසවන්තව අපට කථා කීමට උන්වහන්සේට පහසුවේ.

දෙවියන් වහන්සේගේ සමාවදීම සහ පවිත්‍ර කිරීම පවතින නිසා දේවයින් වහන්සේට ස්තුති වේවා. එහිදී දෙවියන් වහ්නසේගේ අනුග්‍රහය අභිමුඛත්වය, බලය වෙතට හැරී යාමට මාර්ගයක් තිබේ. (1 යොහාන් 2:1:-2) වරද පිළිගෙන ස්වාමීන් වහන්සේ ඉදිරියේ අපගේ ජීවිත යටහත් කරගෙන පසුතැවිලවීම අත්‍යවශ්‍යය. සමාව ලබා ගැනීමෙන් දෙවියන් වහ්නසේගේ සම්පූර්ණ අනුග්‍රහයේ සහ නැවත උන්වහන්සේගේ බලය අප මත උතුරායාමට සැලැස්වීමට දොරටු විවෘත කර ගැනීමට හැකිවේ.

යාච්ඤා කිරීම තුළ බලය

"නුඹලා මා තුළේහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුලේහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා එවිට නුඹලාට ලැබේ." (යොහාන් 15:7)

යාච්ඤා කිරීමේ මෙ අසාමාන්‍ය බලය ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නන්ට ලබාදුන්නේ ඇයි ..? මිල අධික මෙම මුතු ඇටය දිනා ගැනීමට අනර්ඝ ලෙස උත්සහ කිරීමට මට කියන්නට ඇති දේ ඔබට ධෛර්යයක් වේවා...! ක්‍රිස්තුස් වහන්සේ තුළ වාසය කිරීම කරුණුකොටගෙන සහ උන්වහන්සේගේ වචනය අප තුළ පැවතීම, නිදහස්ව යාච්ඤා කිරීම තුළ බහුලව පවතින්නේ ඇයි .. ?

ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය

මාගේ පළමුවන පිළිතුර නම්, ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය නිසාය. ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කරන විට ඔබ ඉල්ලා සිටින දේ වඩා හොඳින් ඉල්ලා සිටිය හැකිය. මක්නිසාද ඔබ ඉල්ලා සිටින දේ කුමක් වුවත් ඒ දේ මේ වන විටත් උන්වහන්සේ තුළ තිබෙන සේක. මෙම අදහස ප්‍රසිද්ධ ඡේදයකින් සකස් කළෙමි. සකස් කරනු ලැබුවා වූ කාරණාවල සාරය මම ඔබට ලබාදෙන්නෙමි. ඔබ ආත්මයාණන් වහන්සේගේ කරුණාවට ඇළුම්ව සිටිනවාද ....? ඔබගේ ස්වාමීන් වහන්සේගේ ආලේපය වෙතට යොමුවෙන්න ඔබ ශුද්ධකම සොයනවාද ..? උන්වහන්සේගේ ආලේපය වෙතට යොමුවෙන්න ඔබ ශුද්ධකම සොයනවාද...? උන්වහන්සේගේ ආදර්ශය වෙතට යොමුවෙන්න. පාපයෙන් නිදහස්වීමට ඔබ කැමතිද ...? උන්වහන්සේගේ ලේ දෙස බලන්න. ඔබට පාපය හෙළා දැකීමට අවශ්‍ය ද ..? උන්වහ්නසේගේ කුරුස පූජාව දෙස බලන්න. ඔබට ලෝකයේ කාරණා උදෙසා මරණයට පත්වීමට අවශ්‍යද උන්වහන්සේගේ සොහොන වෙත යොමුවෙන්න. ස්වර්ගීය ජීවිතයේ පූර්ණත්වය හැගීම ඔබට අවශ්‍යද ... ? උන්වහන්සේගේ නැව නැගිටීම තුළ රැඳී සිටින්න.

ඔබට ලෝකයට ඉහළින් නැගී සිටීමට අවශ්‍යද ... ? උන්වහ්නසේගේ ඔසවා ගැනම වෙතට අවධානය යොමුකරන්න. ස්වර්ගීය කාරණා අරමුණු කර ගැනීමට ඔබට අවශ්‍ය ද ... ? දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ උන්වහන්සේ වාඩිවී සිටින බව මතක තබාගන්න. එමෙන්ම ස්වර්ගීය ස්ථානවල අපව තබා තිබෙන බව අවබෝධ කරගන්න. **"ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ ස්වර්ගීය වූ ස්ථානවල උන්වහන්සේ සමඟ අප හිඳවූසේක."** (එපීස 2:6)

ප්‍රේමවන්තයෙනි.., **"එක්නිසාද උන්වහන්සේ තුළ මුළු පූර්ණකම පැවතීමට, උන්වහන්සේගේ කුරුසියේ ලෙයින් සමදානය උපදවා උන්වහන්සේ කරුණාකොටගෙන සියලු දේ, එනම් පොළොවේ තිබෙන දේවල් වුවත්, ස්වර්ගවල තිබෙන දේවල් වුවත් උන්වහන්සේ කරුණාකොටගෙන තමන්ට සමගිකර ගැනීමටත්, පියාණන් වහන්සේ ප්‍රසන්න වූ සේක."** (කොලොස්සි 1:19-20) පියාණන් වහන්සේගේ සතුට අපගේත් සතුට විය යුතුය. එමෙන්ම යේසුස් වහන්සේගෙන් සියල්ල ලබා ගැනීමටත් අපි සතුටුවෙමු. අපි කැමති දේ ඉල්ලා සිටිමු.

උන්වහන්සේ අප වෙනුවෙන් එය සූදානම් කර ඇති බැවින් නිශ්චිතවම අපට එය ලබා දෙන බව විශ්වාසය ඇතුව සිටිමු.

(චාර්ල්ස් එච්. ස්පර්ජන් විසිනි.) (1834-1892)

වචනයේ බලය

ඊළඟ හේතුව සඳහා දෙවියන් වහන්සේගේ වචනය වෙතට සමීප වෙමු. **"නුඹලා මා තුළේහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළේහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ."** (යොහාන් 15:7) හොඳින් යාච්ඤා කරන මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ පොරොන්දු සමඟ දැඩි විශ්වාසයෙන් සිටින්නෝය. ඇත්තවශයෙන්ම යාච්ඤා කිරීම යනු දෙවියන් වහන්සේගේ පොරොන්දු උන්වහන්සේ වෙතට ගෙන ගොස් උන්වහන්සේට පැවසීම මිස අන් කිසිවක් නොවේ. යාච්ඤා කිරීම පොරොන්දුව ප්‍රායෝගිකව ප්‍රයෝජනයට ගැනීමයි. පොරොන්දුවක් මත පදනම් නොවන යාච්ඤාවකට සැබෑ පදනමක් නැත. චෙක්පතක් නොමැතිව මම බැංකුවට යන්නේ නම් මට මුදල් ලබා ගැනීම අපේක්ෂා කළ නොහැකිය. එය ගෙවීමේ නියෝගය වන අතර එය (චෙක්පත) බැංකුව තුළ මගේ බලය සහ ලැබීමට අපේක්ෂා කිරීම සඳහා මාගේ වරෙන්තුවයි. ප්‍රේමවන්තයෙනි, අපි දෙවියන් වහ්නසේගේ වචනයෙන් පූර්ණවෙමු. මෙම දිව්‍යමය ආනුභාවය ඇති පොතෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් වාර්තා කර ඇති වචනයෙන් ඔබ පෝෂණය වන විට සහ ඒ හා සමානව යේසුස් වහන්සේ පාවසූ දේ අධ්‍යයනය කර, ඔබගේ ඇදහිල්ල වචනය තුළ රඳවාගෙන ඔබගෙ ජීවිතය දේව වචනයට කීකරුවීමට යොමු කරවන්න. එවිට ඔබ යාච්ඤා කිරීමේ වීරයෙක් වනු ඇත.

6 පිටුවට

"එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන් වහන්සේගෙන් බලයෙන් මිස මනුෂ්‍යයාගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය." (1 කොරින්ති 2:5)

5 පිටවෙන්

බැටළු පැටවාණන්ගේ ලේවල...

යම් කෙනෙක් යාච්ඤා කිරීමෙහි සාර්ථක වන විට ඔහුගේ ඇදහිල්ල ශක්තිමත් වේ. එමෙන්ම යාච්ඤා කිරීමෙහි සාර්ථකවීමත් සමඟ එබඳු අය තුළ යේසුස් වහන්සේ වාසය කරන සේක. එම ඇඳහිල්ලෙන් යාච්ඤා කිරීම තුළ ජයගනු ලබන්නෝය. යාච්ඤා කිරීමෙහි සැබෑ චතුර බව විශ්වාස කිරීමට කැමතිවීමයි. **"යේසුස් වහන්සේ, උන්නාර දෙවින්, ඔබට පුළුවන් නම්, විශ්වාස කරන්නාට සියල්ල පුළුවනැයි කී සේක."** (මාර්ක් 9:23) යම් මනුෂ්‍යයෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ වාසය කරන්නේ නම්, ක්‍රිස්තුස් වහන්සේගේ වචනය ඔහු තුළ වාසය කරන සේක. ඇදහිලිවන්තයෙකුට එය ඉතා සුදුසුය. එමෙන්ම ඉතා සුදුසුවීමේ ප්‍රතිඵලය වශයෙන් යාච්ඤා කිරීම තුළ සාර්ථක වේ. සැබවින්ම ඔහුට දැඩි විශ්වාසයක් ඇත. මක්නිසාද ඔහුගේ ඇදහිල්ල ඔහුව ක්‍රිස්තුස් වහන්සේ සමඟ අත්‍යවශ්‍ය සම්බන්ධතාවයකට යොමුකර ඇති අතර උන්වහන්සේ සෑම ආශීර්වාදයකම උල්පත වන බැවින් උන්වහන්සේගේ අවධානය ඇතිව එයින් පානය කළ හැකි වන්නේය.

වැඩවසන්නා වූ ආත්මයාණන් වහන්සේගේ උපකාරය

එවැනි මනුෂ්‍යයෙකුට නැවත වාරයක් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ වාසය කිරීම හිමිවනු ඇත. අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේ නම්, උන්වහන්සේගේ වචනය අප තුළ පවතී නම්, ඊළඟට ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණ අප තුළ නතර වන සේක. යාච්ඤාවේදී ඊට වඩා උපකාරයක් වන්නේ වෙන මෙනාවාද ...? දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව ශුද්ධාත්මයාණන් වහන්සේම ශුද්ධවන්තයන් තුළ මැදිහත්වීම පුදුමයක් නොවේ. "එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරනට අපි නොදනිමුව. නුමුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙදිරිගෑම් වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක. (රෝම 8:26) මනුෂ්‍යයෙකුගේ ආත්මක හැර ඔහුගේ මනස දන්නේ කවුද ..? දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ, දෙවියන් වහන්සේගේ මනස දන්නා සේක. දෙවියන් වහන්සේගේ කැමැත්ත කුමක්ද ඒ අනුව අප තුළ ක්‍රියා කරන සේක. එම නිසා ඇදිහිලිවන්ත මනුෂ්‍යයෙකුගේ යාච්ඤා කිරීමේදී දෙවියන් වහන්සේගේ අරමුණ කඩපතකින් මෙන් ආත්මය තුළ පිළිඹිබුවේ.

දෙවියන් වහන්සේගේ සදාකාල නියෝගවල සැලැස්ම දේව භක්තියෙන් යාච්ඤා කරන්නා වූ මනුෂ්‍යයන්ගේ හදවත්වලට ඉහළින් ඔවුන් අනුව යන්නෝය. දෙවියන් වහන්සේ කරනනට අදහස් කරන දේ උන්වහන්සේ තම මෙහෙකරුවන්ට පවසන්නේ තමන් වහන්සේ කිරීමට අධිෂ්ඨාන කර ඇති දේ කිරීමට, ඔවුන්ගෙන් ඉල්ලා සිටීමට ඔවුන් පෙළඹවීමෙනි. මම මේ දේ කරන්නෙමි කියා දෙවියන් වහන්සේ පවසන සේක. නමුත් ඊළඟට මෙලෙසින්ද ඊට එකතු කර තිබෙන සේක. **"ස්වාමී වූ දෙවියන් වහන්සේ මෙසේ කියන සේක. මෙය ඊශ්‍රායෙල් වංශයට කතාර්න ලෙස මම ඔවුන්ගේ ඉල්ලීමට තවදුරටත් ඇහුම්කන් දෙන්නෙමි. රිළුක් මෙන් ඔවුන්ගේ ගණන වැඩි කරන්නෙමි."** (එසතියෙල් 36:37) ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටිනවා නම්, උන්වහන්සේගේ වචනය අප තුළ පවතී නම් කැමති දෙයක් ඉල්ලන්නැයි පවසා තිබීම කොයිතරම් පැහැදිලිද ... ? දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අපට ඉල්ලා සිටීමට යොමු කරන දේ පමණක් ඉල්ලා සිටිය යුතුය.

අපි ක්‍රිස්තුස් වහන්සේගේ කොටස්කරුවන් වන්නෙමු.

ප්‍රේමවන්තයෙනි, කිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කරන බවත්, උන්වහන්සේගේ වචනය ඔබ තුළ පවතින බවත් ඔබ අවබෝධ කරන්නේ නැති විට පියාණන් වහන්සේට උන්වහන්සේගේ පුත්‍රයාණන් දෙස බලන ඇසින්ම ඔබ දෙසත් බලන්නට පුළුවන්ද..? ක්‍රිස්තුස් වහන්සේ මිදිවැලය. මිදි වැලට අතු ද ඇතුළත්ව තිබේ. අතු මිදිවැලේ කොටසකි. එබැවින් දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ කොටසක් ලෙස අප දෙස බලන සේක. උන්වහන්සේගේ ශරීරයේ උන්වහන්සේගේ මාංශයේ, උන්වහන්සේගේ ඇටවල කොටස් කරුවන් වේ. පියාණන් වහන්සේගේ ආදරය යේසුස් වහන්සේට කෙබඳුද කියනවා නම්, උන්වහන්සේ කිසිවක් ප්‍රතික්ෂේප නොකරයි. උන්වහන්සේ මරණය එසේය කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර මැදහත්කාරකම් කරන්නා ලෙස පියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටින සියල්ල ලබා දෙන්නා ලෙස පියාණන් වහන්සේ යේසුස් වහන්සේට ප්‍රේම කරන සේක. ඔබත්, මමත් ක්‍රිස්තුස් වහන්සේ සමඟ සැබෑ ලෙස එක්සත්ව සිටින විට දෙවියන් වහන්සේ යේසුස් වහන්සේ දෙස බලන ආකාරයෙන්ම අප දෙසත් බලා අපට පවසන්නේ, මම ඔබ ඉල්ලන කිසිවක් ප්‍රතික්ෂේප නොකරමි. ඔබ කැමති දේ ඔබ ඉල්ලන්න. මම ඒ දේ ඔබට ඉටුකර දෙන්නෙමි කියාද ...? එම නිසා මම මේ බයිබල් පදය තේරුම් ගන්නෙමි.

මෙම පදය වෙත මම ඔබගේ අවධානය යොමු කරවන්නෙමි. **"පියාණන් වහන්සේ මට ප්‍රේමකළාක් මෙන්ම, මමත් නුඹලාට ප්‍රේම කළෙමි. මාගේ ප්‍රේමයෙහි පැවතියල්ලා."** (යොහාන් 15:9) පියාණන් වහන්සේ පුත්‍රයාණන් වහන්සේට ලබා දුන් ප්‍රේමයම පුත්‍රයාණන් වහන්සේ අපටත් ලබා දුන් සේක. එබැවින් අපි පියාණන් වහන්සේගේ සහ පුත්‍රයාණන් වහන්සේගේ ප්‍රේමය තුළ පවතින්නෙමු එසේ නම් ඔබගේ යාච්ඤාව ප්‍රතික්ෂේප වන්නේ කෙසේද ..? මැවුම්කාර දෙවියන් වහන්සේ අපගේ ආයාචනා කිරීම නොසලකා හරින සේක්ද ..? ක්‍රිස්තුස් වහන්සේ තුළ ප්‍රිය සහෝදරයා, සහෝදරිය ඔබගේ යාච්ඤාවන් වේගයෙන් ස්වර්ගීය සිංහාසනය වෙතට නොපැමිණෙන්නේ නම් මේ ආකාරයෙන් පියාණන් වහන්සේගේ ප්‍රේමය දැක්වීම මැඩපවත්වා තිබෙන ඊට බාධාවන යම් පාපයක් තිබෙනවාදැයි සෝදිසි කර බලන්න.

ඔබ හිතාමතාම උන්වහන්සේගේ වචනයට අකීකරු වන්නේ නම්, එය යාච්ඤාවේ අසාර්ථකත්වයට හේතු නොවේද ..? නමුත් ඔබ ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේ නම්, උන්වහන්සේගේ වචනය ඔබ තුළ පවතින්නේ නම්, උන්වහන්සේගේ ගෝලයන් ලෙස එකිස්තව සිටින්නේ නම්, ඔබගේ යාච්ඤාවලට උන්වහන්සේ ඇහුම්කන් දෙනවා ඇත. යේසුස් වහන්සේගේ පාමුල සිට උන්වහන්සේගේ වචනයට ඇහුම්කන් දෙන්න. එවිට ඔබගේ දෑස් වලින් උන්වහන්සේගේ ප්‍රේමණීය මුහුණ දෙස බලා "මගේ ස්වාමීනි..., මට ඇහුම්කන් දෙන්න." කියා පැවසිය හැකිය. උන්වහන්සේ ඔබට කරුණාවන්තව ලබා දෙන් කරුණාසනයේ බලය විඳහා දක්වමින් ඔබට මෙසේ කියනු ඇත. **"මක්නිසාද, පිළිගත යුතු වූ කාගයකදී නුඹට ඇහුලුකන් දුනිමි. ගැලවීමේ දවසකදී නුඹට පිහිට වුණෙමියි උන්වහන්සේ කියන සේක. මෙන්න, දැන් පිළිගත යුතු වූ කාලයය. මෙන්න, දැන් ගැළවීමේ දවසය."** (2 කොරින්ති 6:2) **"නුඹලා මා තුලෙහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුලෙහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ."** (යොහාන් 15:7)

බැටළු පැටවාණන්ගේ ලේවල බලය

(රෝයි හෙයිසන් (1908-1992) විසිනි.)

මේ දිනවල අප බොහෝ දෙනෙකුට පැමිණෙන පිඹීදීමේ පණිවිඩය සහ අභියෝගය සෝදිසි කිරීමේ දී එය සම්පූර්ණයෙන්ම වාස්ව (සරලව) තිබේ. කිතුණුවෙකු ජයග්‍රාහිකව දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇති ගමන් කිරීම සහ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණව පැවතීම වලක්වන්නා වූ ලෝකයේ නිරායාසයෙන්ම පවතින්නා වූ එක් කාරණයක් පමණක් ඇත්තේය. එනම්, එක් ස්වභාවයක හෝ වෙනත් ආකාරයක පාපය වේ.

මනුෂ්‍යාව පවිත්‍රකර නිදහස සහ ජයග්‍රහණය ලබාදිය හැකිවන්නේ ලෝකයේ එක් දෙයකටය. එනම්, ස්වාමී වූ යෙස්සු වහන්සේගේ ලේවල බලයට පමණි. කෙසේ වෙතත් අපට ඉතා වැදගත්ව තිබෙන්නේ මනෂ්‍යයා වෙනුවෙන් දෙවියන් වහන්සේ සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරයේ බලය ලබාදෙන්නේ කෙසේදැයි සොයා බැලීමයි. මක්නිසාද එවිට එහි පූර්ණ බලය අත්විඳිය හැකි කොන්දේසි අපට අවබෝෂ වනු ඇත. ශුද්ධ ලියවිල්ලේ සඳහන් වන්නේ ස්වාම වූ යේසුස් වහන්සේගේ ලේවල බලයට මනුෂ්‍යයන්ට කොපමණ ජයග්‍රහණ සහ ආශීර්වාද ලබාදීමට හැකිද කියාය. යේසුස් වහන්සේගේ ලේවල බලය කරුණුකොටගෙන දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර සමාදානය ඇති කළ හැකිය. (කොලොස්සි 1:19-20) ස්වාමී වූ යේසුස් වහන්සේගේ ලේවල බලය කරුණුකොටගෙන උන්වහන්සේ තුළ ඇදහිල්ල තබා ඇති සියල්ලන්ට පාපයට සමාව සහ සදාකාල ජීවනය ලබාදෙන සේක. (කොලොස්සි 1:14, යොහාන් 6:54) යේසුස් වහන්සේගේ ලේවල බලය කරුණුකොටගෙන සාතන්ගෙන් ජයගෙන ඇත. (එළිදරව් 12:11)

යේසුස් වහන්සේගේ ලේ වලින් නොකඩවාම අපගේ පාප වලින් අපව පවිත්‍ර කරන සේක. (1 යොහාන් 1:7) යේසුස් වහ්සේගේ ලේ කරුණුකොටගන අපගේ මළ ක්‍රියාවලින් (නපුරු දුෂ්ඨ ක්‍රියාවලින්) නිදහස්වී දෙවියන් වහන්සේට සේවය කළ හැකිය. (හෙබ්‍රෙව් 9:14) එහි අසීමිත බලය කරුණුකොටගෙන අපවිත්‍ර දේවලින් නිදහස්වී දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ අභිමුඛත්වයට ඇතුල්වීමට සහ සදාකාලයට සරිලන පූජාව ඉටු කළ සේක. (හෙබ්‍රෙව් 10:19) එබැවින් යේසුස් වහන්සේගේ ලේ වලින් ලබා දෙන්නේ මොනවාදැයි තේරුම් ගෙන ඒවා ඉල්ලා සිටිය හැකිය. මේ කාරණා සමඟ යේසුස් වහන්සේගේ ලේවල බලය සම්පූර්ණයෙන් අපගේ ජීවිතවල අත්දකින්නේ කෙසේදැයි ඇසිය හැකිය. උන්වහන්සේගේ අනර්ඝ වූ ලේ වලින් අපව පවිත්‍ර කර සමාදානය ලබා දී ජීවනය ලබා දි අපගේ හදවත්වල ඇති පාපය විනාශකර දමනවා ඇත. සැමදාම දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ සහ උන්වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇතිව අපගේ ජීවිත ගත කිරීමට සොයන්නේ නැති නම් යේසුස් වහන්සේගේ අනර්ඝ වූ ලේවලින් ලබාදෙන පවිත්‍රකම, සමාදානය, ජීවනය සහ අපගේ හදවත්වල ඇති පාපය විනාශකර දැමීම හිමිකර ගත නොහැකිය.

එහි බලය කෙහෙන්ද ... ?

පළමුව මෙම ප්‍රශ්නයට පිළිතුර ප්‍රකාශ කරන්නේ එළිදරව් පොතේ ඉදිරිපත් කර ඇති මෘදු

7 පිටුවට

6 පිටවෙන්

බැටළු පැටවාණන්ගේ ලේවල...

මොලොක් ප්‍රකාශනය වන බැටළු පැටවාණන්ගේ ලේ වශයෙන් ක්‍රීස්තුස් වහන්සේගේ ලේ විස්තර කරන වාක්‍යයෙනි. (රළිදරව් 7:14) වීරයන්ගේ ලේ වලින් නොව නමුත් බැටළු පැටවාණන්ගේ ලේ වලිනි. තවත් ආකාරයකින් පවසන්නේ නම් මනුෂ්‍යයා වෙනුවෙන් දෙවියන් වහන්සේ සමඟ වගුරුවනු ලැබූ ලේවල බලය ලබාදෙන්නේ ලේ වගුරුවනු ලැබූ තැනැත්තා වහන්සේ යන අනර්ඝ වූ ප්‍රකාශයෙන්ය. බැටළු පැටවා යන අදහස ශුද්ධ ලියවිල්ල තුළ බොහෝ විට ස්වාමී වූ යේසුස් වහන්සේට ලබා දී ඇත. සියල්ලටම පළමුවෙන් අපගේ පාපය උදෙසා උන්වහන්සේගේ පූජාවේ ස්වභාවය, උන්වහන්සේගේ කාර්යය විස්තරාත්මකව ප්‍රකාශ කර ඇත. ඊශ්‍රායෙල් සෙනඟට දෙවියන් වහන්සේ සමඟ හරිගැස්සීමට අවශ්‍ය වූ විට බැටළු පැටවෙකුගේ (සමහර අවස්ථාවලදී එළුවෙකුගේ) ලේ වගුරුවා පූජාසනය මත ඉසිනු ලබන්නේය. මනුෂ්‍යයන් පූජා කළ බැටළු පැටවුන්ගේ ලේ දිව්‍යමය ලෙස ඉටු කලේ යේසුස් වහන්සේය. උන්වහන්සේ ලෝකයේ පාපය දුරු කරන දෙනියන් වහන්සේගේ බැටළුපැටවාණෝය. (යොහාන් 1:29)

බැටළු පැටවා යන තේමාව තුළ ගැඹුරු අදහසක් පවතින්නේය. එයින් උන්වහන්සේගේ චරිතය ප්‍රකාශ වේ. උන්වහන්සේ බැටළු පැටවා ලෙස සිතින් මෘදුව, යටහත්ව සිටින සේක. (මතෙව් 11:29) පියාණන් වහන්සේට උන්වහන්සේගේ කැමැත්ත සියලුම අවස්ථාවලදී යටහත්ව මනුෂ්‍යයාට ආශීර්වාද කිරීමට සහ සේවය කිරීමට මෘදුව සහ යටහත්ව සිටි සේක. (යොහාන් 6:38) ඕනෑම කෙනෙක් බැටළුපැටවාණන්ට ලබාදෙන්නා වූ සැලකිලි ප්‍රතික්ෂේප කර ඒවාට අප්‍රසාදය පලකරත් යේසුස් වහන්සේ පියාණන් වහන්සේට කීකරු වූ සේක. (පිලිප්පි 2:8) එමේනම අපට ඇති අදරය නිසා සියල්ල කළ සේක. මනුෂ්‍යයන් තමන් කැමති දේ උන්වහන්සේට කළ අතර උන්වහන්සේ අප වෙනුවෙන් සැමවිටම යටහත් වූ සේක.

උන්වහන්සේට අපහාස කරද්දී, උන්වහන්සේ හැරී ඔවුන්ට අපහාස කළේ නැත. උන්වහන්සේ දුක්විඳින විට උන්වහන්සේ තර්ජනය කළේ නැත. උන්වහන්සේ තමන් වහන්සේගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියේ නැත. නැවත හැරී පහර නුදුන් සේක. අමනාපවීමක්වත්, මැසිවිලිනැගීමක්වත් නොකළ සේක. අපි ඊට වඩා කොපමණ වෙනස්ද .. ? පියාණන් වහන්සේගේ කැමැත්ත සහ අදුරු කල්වාරියේ දී මනුෂ්‍යයන්ගේ දුෂ්ඨ චේතනාවන් (ද්වේශ කිරීම්) වලදී බැටළු පැටවෙකු මෙන් මෘදුව හිස පහත් කරගෙන සිටීමට කැමති වූ සේක. යෙසායා දුටුවා වූ බැටළු පැටවා ගැන ඔහු මෙසේ අනාගත වාක්‍යයෙන් පැවසුවේය. **“උන්වහන්සේට පීඩා කළ විට, උන්වහන්සේ යටත්වී තමන්ගේ මුඛය නොහැර සිටි සේක. මරන්ට ගෙනයන බැටළු පැටවෙකු මෙන්ද, බැටළු දෙනක් ලෝම කපන්නන් ඉදිරියෙහි නිශ්ශබ්දව සිටින්නාක්මෙන්ද උන්වහන්සේ තමන් මුඛය නොහැර සිටියේක.”** (යෙසායා 53:7)

යේසුස් වහන්සේ බැටළු පැටවාණන් නොවූයේ නම් උන්වහන්සේගේ මුහුණේ රැවුල උගුලා දැමීම, සමච්චලයට ලක්වීම, කෙල ගැසීමට ලක්වීම, වෙහෙසට පත්ව සිටියත් අවසන් වරට කල්වාරි කන්දට නැගීම, ඇණගැසීම උන්වහන්සේගේ ඇලය සිදු කිරීම, උන්වහන්සේගේ ලේ ගලායාම ආදී දේවල් කිසිවිටෙකත් සිදු නොවේ. ඒ සියල්ල මාගේ පාපයේ මිලය ගෙවීම සඳහාය. එම නිසා උන්වහන්සේ නිකම්ම බැටළු පැටවා නොවූසේක. මක්නිදා උන්වහන්සේ කුරුසිය මත මැරුණු සේක. උන්වහන්සේ කුරුසිය මත මැරුණේ උන්වහන්සේ බැටළු පැටවාණන් වූ නිසාය.

අපට ලබා දී තිබෙන්නා වූ මෙම ලේවල ස්වභාවය අපි දැකිය යුතුය. යේසුස් වහන්සේගේ ලේ පිළිබඳව සඳහන් කර තිබෙන සෑම දෙයකදීම බැටළු පැටවාණන්ගේ ගැඹුරු නිහතමානීකම සහ තමන්ම යටහත්වීම මතකයේ තබාගන්න. මක්නිසාද දෙවියන් වහන්සේ සමඟ ලේවල පුදුමාකාර බලය ලබාදෙන්නේ මෙම ආකල්පයයි. යේසුස් වහන්සේ, උන්වහන්සේගේ ලේ වගුරුවමින් තමන්වහන්සේම පූජාවූසේක. **“කැළලක් නැතුව සදාකාල ආත්මයාණන් කරුණාකොටගෙන තමන්ම දෙවියන් වහන්සේට පූජාවුණා වූ ක්‍රිස්තුස් වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘදය සාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදු කරනු නොලබන්නේද .. ?”** (හෙබ්‍රෙව් 9:14)

මනුෂ්‍යයා උදෙසා දෙවියන් වහන්සේගේ බලය සමඟ යේසුස් වහන්සේගේ ලේවල බලය පවරාදෙන සේක. මෙම ස්වභාවය දෙවියන් වහන්සේට ඉතා උසස් වටිනාකමක් ගෙන දෙන සේක. නිහමානිකම බැටලු පැටවෙක් මෙන්වීම සහ අපගේ කැමැත්ත දෙවියන් වහන්සේට යටත්කර දීම උන්වහන්සේ මනුෂ්‍යාගෙන් බලාපොරොත්තු වන දේය. පළමු මනුෂ්‍යාව මැවූ විටදීත් දෙවියන් වහන්සේ මේ සියලු දේ පැහැදිලි කර තිබෙන සේක. පළමු මනුෂ්‍යාගේ පළමු පාපය වූයේ මෙම මාර්ගයේ ගමන් කිරීම ප්‍රතික්ෂේප කිරීමයි.

යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේට උවමනා මෙම කාරණය රැගෙන පොළොවට පැමිණි සේක. එය සරලව තිබුණි. මක්නිසාද පියාණන් වහන්සේ, යේසුස් වහන්සේ තුළ මෙය දුටු සේක. එබැවින්, "මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මම ඔහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි" කියා පැවසීමට හැකි වූ සේක. උන්වහන්සේගේ ලේ වැගිරීම දෙවියන් වහන්සේට අනර්ඝ වන අත මනුෂ්‍යයාට සහ මුනෂ්‍යාගේ පාපයට මෙම ආකල්පය උසස් ලෙස බලපෑමක් ඇති කළ සේක.

දෙවන ප්‍රශ්නය

දැන් අපි දෙවන ප්‍රශ්නයට පැමිණ සිටින්නෙමු. අපි යේසුස් වහන්සේගේ ලේවල බලය සම්පූර්ණයෙන්ම අපගේ ජීවිතවල අත්දකින්නේ කෙසේද ... ? අපගේ හදවත් නිසැකවම අපට පිළිතුරු ලබා දෙන්නේය. අපි බැටළු පැටවාණන් දෙස බලන විට උන්වහන්සේ කල්වාරි කුරුසියේ හිස නමාගෙන සිටින සේක. උන්වහන්සේගේ එම නියමයේ ස්වභාවය ඒ ආකාරයෙන්ම ඉටු කිරීමට කැමතිවීම කරුණු කොටගෙන සහ අපගේ පහතට කඩා වැටීමෙන් (අපවම යටහත් කර ගැනීමෙන්) පමණක් බැටළු පැටවාණන්ගේ එම ස්වභාවයට පගුාකරයන්වීමට කැමතිවීමෙන් පමණක් එම ලේවල සම්පූර්ණ බලය අපගේ ජීවිතවලට හිමිකර ගැනීමට දැන ගන්නවා ඇත.

අපි උන්වහන්සේගේ ස්වභාවයට පංගුකාරයන් විය යුතුය. (පිලිප්පි 2:5, 1 කොරින්ති 2:16) උන්වහන්සේගේ මරණය කරුණුකොටගෙන අපට එය පවරාදිය හැකිය. **“නුඹුත් ආත්මයාණන් වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලින්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන වේවා. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත.”** (ගලාති 5:22-23) මෙම පදවල සඳහන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵල ස්වාමී වූ යේසුස් වහන්සේ බැටළු පැටවානන් ලෙස සිටියදී උන්වහන්සේ තුළ ප්‍රකාශ විය. අප තුළත් එම ගුණාංග හට ගැන්වීමට ශුද්ධාත්මයාණන් වහන්සේට අවශ්‍යව තිබෙන සේක. යේසුස් වහන්සේව, දෙවියන් වහන්සේගේ සිංහාසනය වෙතට ඔසවාගනු ලබා බැටළු පැටවාණන් ලෙස තවමත් සිටින බව එළිදරව් පොතේ අපට පවසා තිබෙන ආකාරය අමතක නොකරන්න. උන්වහන්සේට අප තුළ නැවතත් එය ඉටු කිරීමට අවශ්‍යව තිබෙන සේක.

අපි කැමතිද .... ?

මෙම කාරණය සඳහා අපි කැමතිද ... ? තමන් වෙනුවෙන් පෙනී සිටීමින් සහ අන් අයට එරෙහිවන දැඩි නොනැමෙන ආත්මස්වභාවයක් ඇතිව සිටිනවා නම් එම ස්වභාවය බිඳ දමා බැටළු පැටවාණන්ගේ රුධිරයේ පිරිසිදු කිරීමේ බලය අප වෙතට ළඟාවීමට ඉඩ ලබාදිය යුතුය. සමහර පාපයන්ගෙන් අප පවිත්‍රවන පිණිස අපි බොහෝ සෙයින් යාච්ඤා කරනවා සහ අපගේ හදවත්වල සමාදානය ගොඩනැගීම සොයනවා විය හැකිය. නමුත් අපි බිඳ දැමිය යුතු ස්වභාවයන් බිඳ දමමින් සහ බැටළු පැටවාණන්ගේ යටහත්කමේ ස්වභාවයට පංගුකාරයන්වීම පිළියෙල කරගන්නා තෙක් කිසිවක් සිදු නොවේ.

අපි කවදා හෝ කරන සෑම පාපයක්ම දැඩි නොබිඳුණු ආත්ම අභිමානයේ යම් ආකල්පයක් ඇතිකර ගැනීමේ ප්‍රතිඵලයක් වන අතර එක් එක් පාපයේ මූලාශ්‍රය දැකීමට සහ එයට හේතු වූ වැරදි ආකල්ප ආපසු හැරවීමට අපි කැමතිවන තුරු යේසුස් වහන්සේගේ ලේ වල සමාදානය සොයාගත නොහැකිය. නිශ්චිත පසුතැවිලිවීම නිතරම නිහතමානි වනු ඇත. මෙයින් අදහස් කරන්නේ අපට යේසුස් වහන්සේගේ නිහතමානීකම දැනීමට පමණක් උත්සාහ නොකරන බවයි. එයින් අදහස් කරන්නේ අපි ආලෝකය තුළ පමණක් ගමන් කිරීම සහ දෙවියන් වහන්සේ අපගේ ජීවිත තුළ ඇති ඕනෑම පාපයක් අනාවරණය කිරීමට කැමතිවීමයි. බොහෝවිට කුඩා හා සුළු කාරණා වශයෙන් අප විසින් සොයාගනු ලබන දේවල් පිළිබඳව පසුතැවිලිවීමේ සහ යටහත්වීමේ සියලු ආකාරයේ මිල අධික ක්‍රියාවන් සිදුකරන ලෙස ස්වාමීන් වහන්සේ අපගෙන් ඉල්ලා සිටින සේක. නමුත් ඒවා නිවැරදිව තැබීමට අපගේ උඩඟුකමට කොපමණ මිලයක් ගෙවිය යුතුද යන්නෙන් ඒවායේ වැදගත්කම මැනිය හැකිය.

පසුතැවිලිවමට , සමාව ලබා ගැනීමට හෝ යම් කෙනෙකුට කාරණා නැවත හරිගස්වා ගැනීමට උවමනා නම් කළ යුතු දේ උන්වහන්සේ පේවා දුන් සේක. (මතෙව් 5:23-24) අපි යම් කාරණා වලින් ඉහළට ඇවිත් අපගේ සාධාරණ හේතු වලින් විරුද්ධවීම අත්හැර දැමිය යුතු බව යේසුස් වහන්සේ පෙන්වා දෙන සේක. (යේසුස් වහන්සේට එසේ හරිගස්වා ගැනීමට දෙයක් තිබුණේ නැත. අපටත් එලෙසද .. ?) අපි අපට වැරදි කළ අය වෙතට ගොස් අමනාපය අත්හැරදමා සමාදාන විය යුතු බවත්. උන්වහන්සෙ පෙන්වා දුන් සේක. (යෙසුස් වහන්සේට එසේ හරිගස්වා ගැනීමට දෙයක් හෝ කෙනක් සිටියේ නැත. අපට හරිගස්වා ගැනීමට යමක් තිබෙනවාද ..?) අපගේ මිතුරන් සමඟ විවෘතව සිටීමට උන්වහන්සේ අපව කැඳවා ඇත. අපගේ මිතුරන් සැබවින්ම අපව හඳුනාගන්නා අතර එබැවින් අප සමඟ සැබෑ ඇසුරක් ඇතිකර ගැනීමට හැකිවේ. අපගේ උඩඟුකමේ සහ ආත්මාර්ථකාමීත්වයේ ක්‍රියාවන් නින්දා සහගත විය හැකය. නමුත් එවැනි ක්‍රියාවන් මගින් සැබෑ බිඳවැටීම දැනගෙන අපගේ සුපුරුදු ආකල්ප සම්පූර්ණයෙන්ම ආපසු හරවාගෙන බැටළු පැටවාණන්ගේ නිහතමානීකමේ කොටස්කරුවන් බවට පත්විය හැකිය. මෙම එකින් එක කාරණාවලට අපි එකඟවමෙන් බැටළු පැටවාණන්ගේ ලේවලට සියලු පාපවලින් අපව පවිත්‍ර කිරීමට සහ දෙවියන් වහන්සේ සමඟ පවිත්‍රව ගමන් කිරීමටත්, උන්වහන්සේගේ සමාදානය අපගේ හදවත් තුළට ලබා ගැනීමටත් හැකි වේ.

“මම මාංසමය වූ සියල්ලන්ගේ දෙවියන් වහන්සේ වන ස්වාමීන් වහන්සේය. මට කරන්ට අමාරු වූ කිසි දෙයක් ඇද්ද .... ? ” (යෙරමියා 32:27)

Reg. No: DOP/NEWS/21/2023
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

ජීවිතය සහ අවසාන කාලයේ සේවය උදෙසා දිව්‍යමය බලය

පෙරමඟ දූතයා කාර්යාලයේ අප මෙහි කටයුතු කරන ලෙස අපගේ ස්වාමීන් වහන්සේගේ නැවත පැමිණීමට පෙර අවසාන අවස්ථාවේ අප සිටින බව ලකුණු වලින් ඔබටත් දැනෙනවා විය හැකිය. අවසාන කාලයේ එවැනි ලකුණු වශයෙන් යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති, ජාතියක් ජාතියකට විරුද්ධවීම සාගත, වසංගත සහ විවිධ ස්ථානවල භූමිකම්පා පිළිබඳව යේසුස් වහන්සේ කථා කළ සේක. (මතෙව් 24 : 6-7)

උදාහරණ වශයෙන් රුසියාව සහ යුක්රේනය අතර යුද්ධය ගැන අවධානය යොමු කර බලන්න. මෙම යුද්ධය බොහෝ කණස්සල්ලට හේතු වෙනවා පමණක් නොව එය වෙනත් රටවල් සම්බන්ධ වේනා වූ විශාල ගැටුමක් දක්වා වාර්ධනයවීමට බොහෝ ඉඩ ඇත. එය ලෝකයේ ආහාර සැපයීමට ඉක්මනින් බලපෑමක් ඇතිකර ලේකයේ ආහාර අර්බුධයක් ඇතිවීමට හේතු විය හැකිය. මෙම යුද්ධය න්‍යෂ්ටික යුද්ධයක් දක්වා වර්ධනය විය හැකිය. මේ සමඟ ඉරානයේ ඇති න්‍යෂ්ටික ආයුධවල හැකියාව කලාපයටම සහ ඊශ්‍රායලයට තර්ජනයක් විය හැකිය. එමෙන්ම උතුරු කොරියාවේ න්‍යෂ්ටික ආයුධවල ඇති හැකියාව පිළිබඳවත් කරන්නේ කුමක්ද .. ?

මෙහිදී චීනයට ජාත්‍යන්තර මට්ටමෙන් ඇති ආර්ථික බලය, යුධමය හැකියාව සහ දේශපාන අභිලාෂයන් ගැනත් මහත් ලෙස සැලකිලිමත් විය යුතුය. චීනය තායිවානය ආක්‍රමණය කිරීමට තීරණය කරන්නේ නම් ලෝකය ඒ පිළිබඳව කරන්නට අදහස් කරන්නේ කුමක්ද .. ? ගෝලීය වශයෙන් ලෝකය කටයුතු කරන්නේ සහ ලෝකයේ නියෝග පිළිබඳව අළුතින් කරන්නේ කුමක්ද .. ? එසේ නැති නම් යුදෙව් සෙනඟ සහ ඊශ්‍රායෙල්ගේ රාජ්‍ය උදෙසා ලෝකයේ පවතින සතුරුකම වෙනුවෙන් කරන්නේ කුමක්ද ? නිරන්තරයෙන් සහ ප්‍රබල ලෙස වර්ධනය වන්නා වූ ස්වභාවික විපත්ති ගැනත් සැලකිලිමත් වෙන්න. පසුගිය වර්ෂ දෙකක කාලයක් තුළ අපි අත්වින්දා වූ ලෝකයේ පැවතුනා වූ මහා වසංගතය පිළිබඳව සැලකිල්ල දැක්විය යුත්තේ කෙසේද .. ?

අතිරේක ලකුණු

අවසාන කාලයේ දී සිදුවන ලකුණු වශයෙන් ආත්මික සදාචාරමය සහ සමාජීය වහයෙන් මුලාවී බිඳවැටෙන බවත් යේසුස් වහන්සේ පැවසූ සේක. (මතෙව් 24 : 9-12) ඇමරිකා එක්සත් ජනපදයේ බිහිසුණු පරිහානිය ඇතුළුව ලෝකය පුරා මෙම තත්ත්වයම දැන් අපි අත්විදින්නේ නැද්ද.. ? විවාහය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව අවධානය යොමු කරන්න. මෙම කාරණාවල වැදගත්කම අතිශෝක්තියෙන් ප්‍රකාශ කළ යුතු නැත. මැවීම ආරම්භයේදී දෙවියන් වහන්සේ ඉතා පැහැදිලි ලෙස ඒවා මැවූ සේක. උන්වහන්සේ අපව පුරුෂයන් හෝ ස්ත්‍රීන් ලෙසින් නිර්මාණය කළ සේක. පුරුෂයා සහ ස්ත්‍රීය අතර විවාහය නැමති ගැඹුරු සම්බන්ධතාවය නියම කළ සේක. එවැනි පදනමක් සහිත මූලික සත්‍යතාවයන් අත්හැරදමා නැවත අර්ථ කථනය කරන විට අවසාන පැය කොපමණ ප්‍රමාද විය යුතු දැයි කල්පනා කර බලන්න.

අපොස්තුළු පාවුල් අවසාන කාලයේ දී ඒ හා සමානවම ආත්මික සදාචාරමය වශයෙන්, සමාජීය වශයෙන් බිඳවැටීමේ උපද්‍රව තත්ත්වය පිළිබඳව කලින් අනතුරු අඟවා තිබේ. අවසාන කාලය පිළිපඳව පාවුල්තුමා ලබා දී තිබෙන්නා වූ වට්ටෝරුව අද දවසේ දී (වර්තමානයේ දී) ප්‍රධාන මාතෘකා ලෙස දකින්නට තිබේ. **"නුමුත් අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැවිණෙන බව දැනගනින්න. මක්නිසාද මුනුෂ්‍යයෝ තමුන්ටම ප්‍රේමකාරන්නෝව මුදලට ප්‍රේමකාරන්නෝව, පාරට්ටුකාරගන්නෝව, උදාර්විකාරයෝව, අපහාස කාරන්නෝව, මව්පියන්ට අකීකාරවන්නෝව, ස්තුතිවන්ත නොවන්නෝව, අභක්තිකයෝව, ජන්ම ස්නේහය නැත්තෝව, සමාදාන නොවන්නෝව, කේලාම් කියන්නෝව, තෘෂ්ණාව මැඩපවත්වා නොගන්නෝව, ක්‍රුරයෝව, යහපතට ප්‍රේම කාරන්නෝව, ද්‍රෝහියෝව, හිතුවක්කාරයෝව, අහංකාරයෝව, දෙවියන් වහන්සේට වඩා සැපසේලවට ප්‍රේමකාරන්නෝව, දේව භක්තියෝ වේසය දරන නමුත් එහි බලය ඵපා කළ අයව සිටින්නෝය. එබදු අයගෙන් අහක්වෙයන්න."** (2 තිමෝති 3:1-5) මෙම ලැයිස්තුව අපගේ කල්පනාවට ඉතා කණගාටුදායක ලෙස එක් දෙයක් මතක් කර දෙන්නේය. එනම් මේ සියලු ලකුණු අපෝස්තුළුවරුන්ගේ කාලයේ සහාව තුළත් වර්ධනය වෙමින් තිබූ බවයි.

දිව්‍යමය බලය

මෙම ලකුණු සහ එයින් මුදා ගැනීමට ඉතා වැදගත් ලෙස පිඹිදී සිටමට පළව කැඳවන සේක. ලෝකය බලාපොරොත්තු රහිත තත්ත්වයට පත්ව සිටින්නේ නම් දෙවියන් වහන්සේගේ සෙනඟ ලෝකයට ආලෝකය සහ පොළොවේ ලුණු විය යුතුය. එය දැන් ඉටු කළ යුතුය. දේව භක්තියේ බලය ප්‍රතික්ෂේප කරනවා වෙනුවට මෙය දෙවියන් වහන්සේගේ සහාව උන්වහන්සේගේ බලයෙන් පූර්ණවීමට කාලයයි. දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන ආකාරයට ජීවත්වෙමින් උන්වහන්සේ වෙතට අනිත් අයව දිනා ගැනමට උපාකර විය යුතුය. අපගේ ජීවිත සහ සේවය උන්වහන්සේගේ බලයෙන් පූර්ණව තිබීම ස්වාමීන් වහන්සේට අවශ්‍යව තිබෙන බටව සැකයක් නැත. යේසුස් වහ්නසේගේ ගෝලයන් සමඟ මෙසේ පැවසූ සේක. **"බලව වව මාගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සන්සනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලා යයි කී සේක."** (ලුක් 24:49) මළවුන්ගෙන් නැගිට්ටා වූ ක්‍රිස්තුස් වනහන්සේ තුළ ක්‍රියාත්මක වූ එම බයම ස්වර්ගීය පියාණන් වහන්සේ අප තුළත් ක්‍රියාවට නංවන සේක. **"අදහන්නා වූ උන්වහන්සේගේ බලයේ මහත්කම කිවෙක්ද කියාත් නුඹලා දැනගන්න පිණිස නුඹලාගේ සිත් නැවති ඇස් පහදන ලෙසත්ය. උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළ ඉෂ්ට කළා වූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස් වහන්සේව මළවුන්ගෙන් නැගිටුවා සියලු අධිපතිකමටත්, බලයටත්, පරාක්‍රමයටත්, ස්වාමීකමටත් වේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ග ය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළ ස්ක. ඒ සභාව නම් සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණ කරන තැනැත්තා වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේගේ ශරීරයය."** (එපීස 1:19-23)

දෙවියන් වහන්සේගේ මෙම දිව්‍යමය බය උදෙසා අවශ්‍ය සියලු දේ අපට දී තිබේ. **"මක්නිසාද තමන් වහන්සේගේ මහිමයෙන් හා ගුණවත්කමෙන්**

(රිවි කාර්මිවෙල් විසිනි.)

අප කැඳවාගත් තැනන් වහන්සේ දැන ගැනීම කරුණුකොටගෙන, උන්වහන්සේගේ දිව්‍ය බලයෙන්, ජීවිතයටත්, දේවභක්තියටත් අදාළ වූ සියලු දේ අපට දී තිබේ." (2 ප්‍රේත්‍රුස් 1:3)

අප ළඟ සහ ලෝකය පුරා සුභාරංචිය පිළිබඳව සාක්ෂි දැරීමට මෙ බලය අවශ්‍යව තිබේ. **"නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැවිණී කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද, වුළු යුදයෙහිද, සාමාරියෙහිද, පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහු යයි කී සේක."** (ක්‍රියා 1:8)

ඉතිරිය ඉලඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමඟ දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමඟ දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමඟ දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමඟ දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.